සුබසෙත
සත වෙත සිරිසෙත සලසන සතිපත

ශක වර්ෂ 1944 ක් වූ
මීන රවි 03 භාග මැදින් අව දසවක
තිථිය ලත් කිවි දින

54 වැනි කාණ්ඩය
41 වැනි පත්‍රය
ආරම්භය 1969 - 05 - 28

වෂී 2023 මාර්තු 17 සිකුරාද
subasetha@lakehouse.lk
SUBASETHA, FRIDAY, MARCH 17 2023

බුධ සහ නැප්චූන් ග්‍රහ යුද්ධයෙන්

නැප්චූන් ජයග්‍රහණය සුබදායක වෙයිද?

- ● අවබෝධ ඥානයෙන් කටයුතු කළ යුතු කාලයක්
- ● දැහැමි දිවියකට පත්වීම සුබදායක වෙයි
- ● දුර දිග බලා තීන්දු තීරණ ගත යුතුයි
- ● උෂ්ණ රෝග සමාජයේ පැතිරිය හැකි කාලයක්
- ● ජලජ ප්‍රාණීන්ට - අස් - ඇත් - ගව ආදී සතුන්ට ද කරදර විපත්

2023 මාර්තු 16 වැනි ඊයේ දින රාත්‍රී දා 10.45ට බුධ ග්‍රහයා සහ නැප්චූන් ග්‍රහයා යුද වැදුණු අතර එමගින් නැප්චූන් ජය අත්කර ගනු ලැබීය. බුධ, කුජ, ගුරු, සිකුරු, ශනි,යුරේනස්, නැප්චූන් යන ග්‍රහයන් අතර පමණක් ග්‍රහ යුද්ධ ඇති වන අතර රවි- චන්ද්‍ර දෙදෙනා අතර යුද්ධ ඇති නොවේ. ඒ දෙදෙනා අතර යෙදෙන්නේ ග්‍රහණ පමණක් වේ.

ග්‍රහ යුද්ධ යනු ග්‍රහයන් දෙදෙනෙක් එකම රාශියක එකම අංශකයේ ගමන් කිරීමයි. එසේ ගමන් කරන විට එක් ග්‍රහයකු ගේ රශ්මිය අනිත් ග්‍රහයාට ආවරණය වීමෙන් එම රශ්මිය පොළොවට නොවැටේ. එය ග්‍රහ යුද්ධය ලෙස හඳුන්වයි. ග්‍රහ යුද්ධයේදී උතුරෙන් සිටින ග්‍රහයා ජය ලබයි. යුද්ධයෙන් පැරදුණු ග්‍රහයා අසුබ ග්‍රහයෙක් ලෙස සලකයි. ග්‍රහ යුද්ධ පවතින දින සුබ නැකත් සඳහා යොදා නොගනියි. එය අසුබ දිනයක් ලෙස සලකන බැවිනි.

මෙහිදී මෙම ග්‍රහ යුද්ධය මීන රාශියේ දී සිදු වූ අතර මීනය බුධට නීච රාශියකි. එම නිසා මෙම කාල සීමාව බුද්ධිමතුන්ට අසුබ ඵල ලැබෙන කාලයක් බව සිහි තබා ගත යුතුය. එනිසා අවබෝධ ඥනයෙන් කටයුතු කළ යුතු කාලයකි. දුරදිග බලා තීන්දු තීරණ ගැනීම වැදගත්ය.

කුඩා දරු දැරියන්ට අපල ගෙන දේ. බියජනක හැඟීම් ඇති විය හැක. උෂ්ණ රෝග සමාජයේ පැතිරී යා හැකි කාලයකි. ආයුධ බය හා රෝග බිය ඇතිවිය හැක. ගව ආදී සතුන්ටද හානි යෙදේ. රසවත් ආහාරවල මිල ඉහළ යාමට ඉඩ ඇත. වෛද්‍ය වෘත්තියෙහි යෙදෙන අයට ද පීඩා ඇති වේ. ජලජ ප්‍රාණීන්ට අස් ආදී සතුන්ට ද වෙළඳ ආයතනවලට ද කරදර විපත් ඇති විය හැක. එනිසා දැහැමි දිවියකට හුරු ව දැහැමි ව කටයුතු කළ යුතු කාලයක් වන්නේය. ඒ ඒ ලග්නවලට මෙම ග්‍රහ යුද්ධය බලපාන අයුරු.

මේෂ ලග්නය

අමතක වීම් ඇති විය හැක සැලකිල්ල අඩු කමෙන් ඉගෙනීම් ආදියට බාධා ඇතිවේ. විවේකය අඩු වේ. අනවශ්‍ය දුරාචාර වැඩ වලින් ඉවත් වී කටයුතු කළ යුතුය.

වෘෂභ ලග්නය

හිතේ දුර්වල ගති මානසික කරදර පීඩා ඇති විය හැක. ආර්ථික තත්ත්වයේ වෙනස්වීම් ඇතිවිය හැක. ප්‍රේම සම්බන්ධතා යෙදිය හැක.

මිථුන ලග්නය

ලග්නාධිපති බුධ ය. එම බුධ යුද්ධයෙන් පැරදී නීචව සිටීම සුබ මදි. කරන කියන කටයුතු වලට රැකියා වලට බාධා ඇතිවෙයි. තම මතය අනුව කටයුතු කිරීමට යාමෙන් අලාභ හානිය ඇතිවිය හැක. අසහන ගති ඇතිවේ.

කටක ලග්නය

සිතාමතා කටයුතු කිරීමේ ශක්තිය අඩුවේ. මානසික දුර්වලතා අහංකාර ගති ඇති විය හැක. ගමන් බිමන් යෙදේ. අපවාද ලැබීමට ද ඉඩකඩ තිබේ. කල්පනාකාරීව කටයුතු කළ යුතුය.

සිංහ ලග්නය

2 සහ 11 අධිපති බුධ අටේ නීචව බල රහිත ව ඇත. රහස්‍ය ලෙස කටයුතු කිරීමේ හැකියාව ඇති වේ. පොළොවෙන් ලැබීම් වලට ද වාසනාව උදා විය හැක. නහර ගත පීඩා ඇතිවිය හැක.

කන්‍යා ලග්නය

බුධ ලග්නාධිපති සහ 10 අධිපති ය.

මානසික සහනය අඩුවෙයි. දුරදිග බලා කටයුතු කළ යුතුය. නැතිනම් අපහසුතාවයන්ට පත් විය හැක. නහරගත පීඩා මෙන්ම විවාහක අයගේ යුගදිවියේ ගැටලු ද ඇති විය හැක. හවුල් ව්‍යාපාර කටයුතුවලටද බාධා වේ.

තුලා ලග්නය

තුලා ලග්නය හිමි අයට ද ශාරීරික රෝග පීඩා මෙන්ම මානසික පීඩා ද ඇති විය හැක. ස්නායු දුර්වල නහර ගත පීඩා යෙදිය හැක. කාන්තා පක්ෂයට වැඩි වශයෙන් උෂ්ණ රෝග පීඩා ඇති විය හැක. දුරදිග බලා කටයුතු කළ යුතුය.

වෘශ්චික ලග්නය

දුරදිග බලා කටයුතු කිරීමේ ශක්තිය අඩුවිය හැක. ආර්ථික අපහසුතා ද ඇති වේ. ගුප්ත දේවල් වලට උනන්දුව ඇතිවේ. සෙම් දෝෂ පීඩා මානසික දුර්වලතා මෙන්ම රැවටීම් මුලාවීම්වලට ලක් විය හැක.

ධනු ලග්නය

විචාර බුද්ධියට බලපෑම් ඇතිවේ. ගෙදරදොර දියුණුවට බාධා කරදර ඇතිවිය හැක. පැරණි ගෙවල් වලට භූත දෝෂ යෙදිය හැක. පවුලේ වාද විවාද මතභේද ඇති විය හැක. රැකියාව විවාහය වැනි කටයුතු වලට අසුබ යෙදේ.

මකර ලග්නය

තම අදහස් උදහස් වෙනස් කිරීමට අකමැති අතර මන්දගාමීව කටයුතු කරයි. ධෛර්යය - මතක ශක්තිය අඩුවිය හැක. කතාව නිසා ප්‍රශ්න කරදර ඇති විය හැක. දුසිරිත්වලින් වැළකිය යුතුය.

කුම්භ ලග්නය

දුර දිග සිතා බලා කටයුතු කිරීමේ ශක්තිය අඩුවේ. හිසේ පීඩා දත්වල අමාරු ඇතිවිය හැක. කරන කියන කටයුතුවලින් පාඩු වීමට ඉඩ තිබේ. අගහිඟතා ද ඇතිවේ. යුග දිවියේ ගැටලු බාධා ඇතිවේ.

මීන ලග්නය

කාලයේ හැටියට වෙනස් නොවී ආවේණිකව කටයුතු කිරීමට පෙළඹෙයි. ක්‍රමානුකූලව කටයුතු කිරීමේ ශක්තිය අඩුවේ පිත් රෝග මෙන්ම අර්ශස් වැනි රෝග ද ඇති විය හැක විවාහකයන්ට පවුලේ ප්‍රශ්න ද ඇතිවිය හැක.

ප්‍රවීණ ජේ‍යාතිෂවේදී
සෝමපාල විජේසූරිය

රවි–බුධ–මීන රාශි ගතවෙද්දී බුධ–නැප්චූන් යුද වදී

රවි බුධ මීන රාශි ගත වීම හා බුධ – නැප්චූන් යුද්ධය පිළිබඳ සමාලෝචනයක්

මීන රාශිය කටක නවාංශකය, පුවපුටුප 04 පාදය, උත්‍රපුටුප 01,02,03,04 රේවති 01,02,03,04 පාද ගුරු, ශනි, බුධ ග්‍රහයන් හිමිව අප්‍රියෙල් 14 පස්වරු 02.59 දක්වා උත්තරායනය වසන්ත ඍතුවෙහි මැදින් මහේ අටවක තිථිය මීන රවි 01 භාගය මාර්තු 15 බුධ දින පෙරවරු 06.34 ට සුරගුරු හෙවත් බ්‍රහස්පති හිමි මීන රාශියට සූර්ය දිව්‍ය රාජයාණෝ කෝණමාසය ද උදා කරලමින් සංක්‍රමණය විය. නැගෙනහිර ක්ෂිතිජයෙහි බ්‍රහස්පති හිමි මීන රාශි උදාවෙහි බ්‍රහස්පති ස්වක්ෂේත්‍රව රවි මිත්‍රශීලිව නැප්චූන් ස්වක්ෂේත්‍ර මූල ත්‍රිකෝණව ද යුරේනස් සමව සිකුරු සමව රාහු සතුරුව 02 වැන්නවූ ධනස්ථානගතව ද මාන්දි ග්‍රහයාගෙන් 03 වැන්නවූ වික්‍රමස්ථානයද සෙන්පති අඟහරු 04 වැන්නෙහි සතුරුවද කේතු සතුරුව 08 වැන්නවූ මෘත්‍යු ස්ථානගතව ද චන්ද්‍රයා නීචව 09 වැන්නවූ භාග්‍යස්ථාන ගතවද ප්ලූටෝ සතුරුව අයස්ථානය වූ 11 වැන්නේද සෙනසුරු ස්වක්ෂේත්‍රව මූල ත්‍රිකෝණව බුධ සමව 12 වැන්නවූ වැය ස්ථානගතවද 04 -07 ට අධිපති බුධ ග්‍රහයා 07 වැන්නෙහි බාධක ග්‍රහයා ලෙසටද 03 -07 අධිපති බුධ ග්‍රහයා මාන්දි ග්‍රහයා මෙන්ම 22 වැනි මාරක දෙර්කාණාධිපති ලෙස ද විශ්ව තාරකා මන්දාකිණිය විද්‍යමාන විය.

මාර්තු 15 පෙරවරුවෙහි බ්‍රහස්පති හිමි මීන රාශියට රාජ්‍යකාරක රවි සංක්‍රමණය ද එලෙසම ඥානකාරක බුධ මාර්තු 16 පෙරවරු 10.48 ට බ්‍රහස්පති හිමි මීන රාශියට නීචක්ෂේත්‍රව සංක්‍රමණය වීම ද මෙදිනම බුධ නැප්චූන් ග්‍රහ යුද්ධයක් රාත්‍රී 10.44ට නිර්මාණය වීමෙන් නැප්චූන්ගේ විජයග්‍රහණයක්ද සෞරග්‍රහ මණ්ඩලයෙහි ග්‍රහණය වෙන්නේය.

මෙම ග්‍රහ සංක්‍රමණය අනුව,

කාලගුණික, දේශගුණික විෂමතාවන් අනුව ගිනි කඳු, අයිස් කඳු කඩා වැටීම් භූ කම්පන , නායයෑම්, ගිලාබැසීම්, අකුණු ගැසීම් , ගංවතුර ගැලීම්, කුණාටු, චණ්ඩ මාරුත, දෙස් විදෙස්හි නිර්මාණය වී යාමෙහි ප්‍රවණතාවක් විශ්ව තාරකා මන්දාකිණිය ආශ්‍රිත ගමන් මඟෙහි විද්‍යමාන වෙයි. චරිතවත් කුල කාන්තාවක් මූලිකව කීර්තිය, ප්‍රශංසාව, ගෞරවය ලබා දෙයි. සාමය, සමඟිය, මුවහත්වී යාමෙහි මාර්ග බහුල කෙරෙයි. සමස්ත පුරවැසි ජනතාවම ඔවුන්ගේ ප්‍රෞඪත්වය, පෞරුෂත්වය මත රැකීරක්ෂා ආදායම් මාර්ග, සම්පාදනය කර ගැනීම සිදු කරනු ලබයි. තර්ජන, වර්ජන, ගර්ජන, කැරලි කෝලාහල දෛනිකව ඉහළයයි. පෞද්ගලික ව්‍යාපාර , කර්මාන්ත ආශ්‍රිතව අවරෝහණ ධාරිතාවක් උච්ඡ ස්ථානගත වෙයි. ප්‍රවාහනය, විදුලිය, ආශ්‍රිතව ගැටුම්කාරී බවක් විද්‍යමාන කෙරෙන සුළුවෙයි.

ග්‍රහ යුද්ධය අනුව කුණාටු සහ භූමිකම්පා ආශ්‍රිතවද ආරාවුල් මතභේද ගැටුම්කාරී බව ආදී භේදභින්නකම් හි නැප්චූන් ප්‍රධානත්වය දරයි. පෘථිවියෙහි ජීවාත්මක බලය විපරීත විකෘතිකර බවට පාත්‍ර කෙරෙනුයේද නැප්චූන් නම් පෙරළිකාර ග්‍රහයාගේ විස්මිත ක්‍රියාකාරකම්හි බලපෑමෙනි. 1846දී යුරේනස්ගේ ග්‍රහ ගමන්මඟ දැඩි පරීක්ෂාවට එකල විද්‍යාඥයන්ගේ අවධායට තුඩු දුන්නෙකි.

මෙහිදී වෙනත් ග්‍රහයකුගේ ආශ්‍රිතයෙහි සංඥාවන් පිළිබිඹු වූයේය. එනම් මෙම නැප්චූන් ග්‍රහයා පිළිබඳවයි. මහා පරිමාණ ව්‍යාපෘති සමාරම්භයේදී නැප්චූන්ගේ බලපෑම නොඅඩුව හිමිවේ.

එලෙසම වයිරස්, වසංගත ඇතිවීමේ ප්‍රවණතාවද ඇතිවේ. මෙම සියළු ග්‍රහ තත්ත්වයන් ඔබේ ලග්නයට බලපාන්නේ මෙලෙසයි.

මේෂ රාශිය

පදිංචිය, යුගදිවිය, රැකියා, ආදායම් මාර්ග ආශ්‍රිතව යම් යම් ආකූල ව්‍යාකූල බවක් උද්ගත විය හැකි ය. අධ්‍යාපනය, අධිකරණය, සෞඛ්‍යය, ජීවන තත්ත්වය අනුව කෙබඳු ආකාරව විසඳාගත හැකි බවක්ද නොපෙනෙන ජීවන වියදම් පැතිකඩ උත්සන්න බවක් පෙනී යයි. මානසිකව දැඩි අසහනකාරි බවක් ද පෙනෙයි.

වෘෂභ රාශිය

මන්දගාමි බවකින් ද සොර සතුරු ආශ්‍රිතවද ලැබීම් මාර්ගයන්හි විවිධ හැලහැප්පිලි බාධක අවහිර දුෂ්කරතා මීන රවිය බුධ නීචයද බුධගේ පරාජයද අනුව වෘෂභ රාශි තත්ත්වය දුර්වල විය හැකිය. යුගදිවි සබඳතා හවුල් කාර්යභාරයන් ආශ්‍රිතව දැඩි නොසන්සුන් බවක්ද ආරම්භ විය හැකිය. බුද්ධිමත්ව දූරදර්ශිව ක්‍රියාකාරිවීම ශුභවාදීය.

මිථුන රාශිය

පෞද්ගලික ජීවිතය, ව්‍යාපාරික ක්ෂේත්‍රය සාර්ථකත්වය කරා පා තබයි. රෝගාබාධ සතුරු කරදර අනතුරු ඇතිවිය හැකිය. සමාරම්භක කාර්යභාරයන් කෙරෙහි අවහිර බාධක දුෂ්කරතා හමුවනු ඇත. ඉවසිලිවන්තව ක්‍රියාකිරීම වැදගත් වේ.

කටක රාශිය

සබඳතා, අධ්‍යාපනය, විභාග, තුරඟ තරග ඉහළින්ම විජයග්‍රහණය කරා තුඩුදෙයි. ප්‍රභූ ජනතාව ඇසුර ප්‍රිය මනාප වෙයි. පෞද්ගලික ව්‍යාපාරික පසුබිම උසස් තත්ත්වයක් ගනියි. සමාරම්භක ව්‍යාපාරික මෙන්ම පෞද්ගලික ජීවන ගමන් මඟෙහි ක්‍රියාකාරකම් උසස් ආකාරව සාර්ථකත්වයක් මත ප්‍රතිඵල ගෙනදෙනු ලබයි.

සිංහ රාශිය

ප්‍රධානින්ගේ මන්දගාමි ගමන්මඟ ව්‍යාපාර ආයතන කෙරෙහිද බලපානු ලබයි. තුරඟ තරඟ නඩුහබවලින් විජයග්‍රහණය ගෙනදෙනු ලබයි. ප්‍රධානීන්ගේ ක්‍රියාකාරකම් මන්දගාමි බවක් උසුලයි. තිරසර සිතැඟියාවන් අනුව උණුසුම් අරමුණ සාර්ථක කෙරෙනු ඇත.

කන්‍යා රාශිය

නව ජීවන ගමන් මඟක් සමාරම්භ කෙරෙයි. පෞද්ගලික ව්‍යාපාරික ක්‍රියාකාරකම් සාර්ථකත්වයට පාත්‍ර කෙරෙයි. වරින්වර සමාරම්භක කටයුතු තවදුරටත් කල්තැබීමට සිදුවනු ඇත. සබඳතා විවාහ කටයුතු සාර්ථකත්වය කරා ගමන් කරයි. සමාජගත ක්‍රියාදාමයන් කෙරෙහි අතහිත දෙයි. සංස්කෘතික මෙන්ම සුබසාධන සේවා ආශ්‍රිතව උපරිම කැපවීම් කෙරෙනු ඇත.

තුලා රාශිය

බලාපොරොත්තු රහිතව දෙස් විදෙස් සංචාරක සේවා මෙන්ම දිගුකාලින වූ හෝ හදිසි ආබාධිත වූ තත්ත්වයන් මර්දනයෙහි කාර්යශීලිව ක්‍රියා කරනු ලබයි. උත්සව ආදි ක්‍රියාකාරකම් යෙදෙනු ඇත. සබඳතා විවාහ මංගල කටයුතු සාර්ථකත්වයට පමුණුවයි.

වෘශ්චික රාශිය

බලාපොරොත්තු රහිත ක්‍රියාකාරකම් මානසික මෙන්ම ශරීරික රෝගාබාධ පෙන්වයි. පදිංචි නිවාසය භූමිය ආශ්‍රිතවද පෞද්ගලික ව්‍යාපාරික ක්‍රියාකාරකම්ද බොහෝ දුරට ඇනහිටිය හැකි බැවින් සන්සුන්ව සියලු කාර්යයන්හිදී පෙරමුණ ගත යුතුය.

ධනු රාශිය

පදිංචි ස්ථානය භූමිය ආශ්‍රිතව නව ආදායම් මාර්ග වර්ධනය කෙරෙයි. හවුල් කටයුතු මෙන්ම විවාහ කටයුතු සාර්ථක කෙරෙයි. මංගල උත්සව ප්‍රියසම්භාෂණ පදිංචි ස්ථානය ආශ්‍රිතව සමාරම්භ වෙයි. රෝගාබාධ ආදිය කල්ගත වෙයි. ශාරීරික පීඩා ගෙන දිය හැකි බැවින් කල්පනාකාරීව ක්‍රියා කළ යුතු කාල පරාසයකි.

මකර රාශිය

මීන රවිය නැප්චූන්ගේ විජයග්‍රහණය බුධ මීන රාශියට සංක්‍රමණය වීම මත බොහෝදුරට නිර්මාණශීලි බැව් වැඩි දියුණු වෙයි. විශ්ව මේෂ රාශි කේන්ද්‍ර සටහනට අනුව ජීවිතයෙහි කඩිනම්ව අධිවේකගීව ක්‍රියාකළ යුතු භාග්‍යමත් කාල පරාසයකි. මන්දගාමී බැව් මඟැහරී යනු ඇත.

කුම්භ රාශිය

දිගුකාලීන සිතැඟියාවන් බහුතරයක් සාර්ථකත්වයට පමුණුවා ගත හැක. මන්දගාමී බවක් නිතර මානසිකව පහළ කෙරෙන බවක් ද නිර්මාණය වෙනු පෙනීයයි. සබඳතා විවාහ මංගල කටයුතු සාර්ථක කෙරේ. රැකියා ආදායම් මාර්ග අවස්ථාවන්ද උද්ගත වනුඇත.

මීන රාශිය

සමාරම්භක කාර්යභාරයන් හි බාධා අවහිර දුෂ්කරතාවලින් දුරුව ඉටුකර ගැනීමෙහි අවස්ථාව සැලසෙයි. ව්‍යාපාරික මය ගනුදෙනුවලදී සුබවාදී බවක් මතු කෙරේ. උත්සව මංගල කටයුතු ආදියෙහි සහභාගිත්වයද සැලසෙයි. රැකියා ආදායම් මාර්ගයන්හි දී සතුටුදායක බවක් මතු කෙරෙනු ඇත. ප්‍රභූ ජනයා ඇසුරට ලැබේ.

ප්‍රවීණ ජ්‍යොතිෂවේදී

විජිත ඩී. ලියනආරච්චි



යුගදිවිය අවුල් කරන ග්‍රහයෝ

සැපවත් පවුලක පරමාර්ථය වන්නේ ප්‍රීතිය හා සොම්නස බවයි කාගේත් පිළිගැනීම. එය එසේ වන්නේ අප ඉපදුන මොහොතේ අහසේ උදාවී තිබුණ ග්‍රහ තාරකාවන්ගේ සුබ අසුබතාවයන් අනුවය. මෙම ග්‍රහයන් පිහිටා තිබුණ පිළිවෙළටයි අපි කේන්ද්‍රය කියල කියන්නේ. කේන්ද්‍රයක් තිබුණත් නැතත් ජ්‍යෝතිෂයට පිටුපාන්න කිසිවෙකුටවත් බැහැ. උපන් මොහොතේ හැටියට කේන්දරය ඉබේම සැදී ඇත. ඒ අනුව උපතේ සිට මිය යන තුරාම සියල්ල අකුරට සිදුවනු ඇත.

විවාහය, කෙනෙකුගේ ජීවිතයේ වැදගත්ම සිදුවීමකි. එය අපේ දෙවැනි ඉපදීම ලෙසයි අපි සලකන්නේ. මේ අයුරින් වන විවාහය සාර්ථක හෝ අසාර්ථකවන්නේද කේන්ද්‍රයේ පිහිටි ග්‍රහයන්ගේ ශුභ අශුභතාවය අනුවමය. මේ අයුරින් විවාහයක් අසාර්ථකවීමට බලපාන ග්‍රහ සංයෝග ජ්‍යෝතිෂයේ මේ අයුරින් දැක්වෙයි.

කේන්ද්‍රස්ථාන

කේන්ද්‍රයක් විවාහයක් පිළිබඳව පරික්ෂා කිරීමේදී හත්වැන්නත්, හත්වැන්නේ ත්‍රිකෝණ ස්ථානවූ තුන්වැන්නත්, එකොළොස්වැන්නත්, විශේෂයෙන් සැලකිල්ලට යොමුවිය යුතුය. එමෙන්ම දෙවැන්න හා අටවැන්නද මේ සඳහා විශේෂ බලපෑමක් කරයි. හත්වැන්නාධිපති එකොළොස්වැන්නේ සිටීම බහු විවාහ යෝගයක් ලෙස සැලකෙයි. මෙවැනි යෝගයක් ඇති පුද්ගලයෝ තම විවාහක බිරිඳගෙන් පමණක් සෑහීමකට පත් නොවන අතර, වෙනත් ස්ත්‍රීන්ගේ ඇසුරට පත්වෙයි. එමෙන්ම හත්වැන්න අධිපතියා බලවත් අශුභයකුවී එකොළොස්වැන්නේ සිටියදී අශුභ ග්‍රහයන්ගේ දෘෂ්ටිය වැටීමද විවාහය බිඳ වැටීමට හේතුවනු ඇත.

කෙනෙකුගේ කේන්ද්‍රයේ ලග්නයේ සෙනසුරු, රාහු, කේතු, අඟහරු යන ග්‍රහයින්ගෙන් කීප දෙනෙකු හෝ එක් ග්‍රහයකු සිටියත් ඔහුගේ හෝ ඇයගේ යුගදිවියේ මිහිර වැඩිකලක් නොපවතියි.

හත්වැන්න

එසේම කේන්ද්‍රයේ හත්වැන්නේ රාහු, කේතු, අඟහරු යන පාපියෙකු සිටීමද විවාහය අවුල්කර දමන ග්‍රහ පිහිටීමක් වෙයි. එසේම තවත් විවාහ දිවියට අශුභපල දෙන ග්‍රහ යෝගයක් නම් අඟහරු, ගුරු එකට හත්වැන්නේ සිටීමයි. කුජ, ගුරු හතේ සිටි අයගේ විවාහ ජීවිතය වර්ෂ ගණනකින් නොව මාස දින ගණනකින් හෝ බිඳ වැටීමට පුළුවන. චන්ද්‍රයා ධනුවේ සිටියදී හෝ ධනු ලග්නයෙන් ඉපදී හෝ සිටින අයගේ මිථුනයේ කුජ, සිකුරු සිටීමෙන්ද විවාහ කීපයක් වී යුගදිවියේ අවුල් තත්ත්වයක් ඇතිවේ. එසේම චන්ද්‍ර, රවි, කුජ යන ග්‍රහයන්ගෙන් කීපදෙනෙකු හෝ එක ග්‍රහයෙකු ධනුවේ සිටියොත් එයද විවාහ දිවියේ ප්‍රශ්න ඇති කරන්නකි.

කුජ, සිකුරු වෘෂභයේ වීමත්, එමෙන්ම ශනි, කුජ සප්තමයක් යෙදී තිබීමත් අධික කාමාධිකකම නිසා වරදේ බැඳීමෙන් යුගදිවියේ අවුල් සහගත බවක් ඇති කරවයි. ලග්නයේ පාපියෙකු සිටියදී චන්ද්‍රයාත්, සිකුරාත් පාපීන් සමඟ සිටින තැනැත්තෙකු හෝ තැනැත්තියක සමඟ විවාහයට පත්වීමද පිරිහීමට හේතුවෙයි. ලෙඩ දුක් ඇතිවී මරණයට පත්වීමට ද හේතුවිය හැකිය.

කුජ බලපෑම

කුජ හත්වැන්නේ සිටීමද විවාහයට යහපත් පිහිටීමක් නොවේ. බොහෝවිට නියම වයසට කලින් විවාහ ජීවිතයට ඇතුළත් වේ. ඔවුන්ගේ ජීවිත පසුබිමද හොඳ නැත. තමන් උපයාගත් වස්තුව හා ධනයද නාස්ති කර ගනී. එවැන්නන් සමඟ යුගදිවි ගත කිරීම පහසු නොවේ. ගුරු, ශුක්‍ර ආදී සුබ දෘෂ්ටියක් නොලැබ කුජ හතේ නීචව දුර්වල අවස්ථාවක සිටියොත් දික්කසාදවීමට හෝ වෙන්වීමට හෝ අනෙකාගේ මරණයට පවා හේතුවෙයි. ස්ත්‍රීන්ගේ කේන්ද්‍රයේ හතේ කුජට වඩා පුරුෂයින්ගේ කේන්ද්‍රයේ හතේ කුජ අශුභ පැත්තට බලවත් වෙයි. මහජන විරෝධතාවලට පවා මුහුණපෑමට සිදුවෙයි. රෝගී ද වෙයි. පුරුෂයාගේ හතේ කුජ ස්ත්‍රිය මැරීමට පවා සිත් යොමු කරයි.

කුජ කටකයේ වීමද විවාහයට එතරම් සුබ නොවේ. නිතර දෙදෙනා අතර, වාද විවාද ඇතිවෙයි. ගෘහ ජීවිතය පවත්වාගෙනයාමට බොහෝ කරදර විඳීමට සිදුවේ. ජීවිතයේ පසු කාලය ඉතා දුක් කරදර සහිත වෙයි. දෙවෙනි දේර්කාණයේ නම් ප්‍රේම සම්බන්ධතා අධික වේ. තුන්වෙනි දේර්කාණයේ නම් සමාදානයට ප්‍රියවේ. කුජ වෘෂභයේ සිටින අය අධික කාමාශාවෙන් යුතු අය වෙති. තරුණ වයසේදීම විවාහ දිවියට ඇතුළත් වෙති. ප්‍රේම සම්බන්ධතා තුළින් නොයෙකුත් කරදර ඇතිකර ගනිති. නෑදෑයින් පවා විරුද්ධ කර ගනී. නඩුමගට බසින්නට වුවමනා කරුණ තමන් විසින්ම ඇතිකර ගනියි. සමාජය සල්ලාලයකුසේ සලකයි. මොවුන්ගේ විවාහ ජීවිතයද අසාර්ථක වෙයි. අවසානයේ දරුණු විපත්වලට පවා ගොදුරුවීමට හේතුවේ.

ශනි බලපෑම

ශනි කටකයේ සිටීමද විවාහ ජීවිතයෙන් තෘප්තියට පත්නොවී මානසික පීඩාවට ලක්වීමට හේතුවක් වෙයි. මේ නිසා ගෘහ ජීවිතයේ නිතර කරදර හා වියවුල් ඇතිවෙයි. අනියම් සම්බන්ධවලින් දුක් කරදර හා පාඩුද ඇතිකර ගනී. ලැබෙන දරුවන් පවා නිතර රෝගී වෙති. විවාහය සම්බන්ධ ස්ථානය වූ හත දුර්වලනම් විවාහයෙන් අවනම්බු විඳීමටද සිදුවේ. ජීවිතයේ අවසාන භාගය යහතින් ගත නොවේ. මෙවැන්නන්ට ගිහි ජීවිතයට වඩා තපස් ජීවිතය යහපත් වෙයි.

ශනි මංගල යෝගය

කේන්ද්‍රයක ශනි මංගල යෝගයද විවාහයට අසුබ ඵලදෙන පිහිටීමක් වෙයි. ශනි මංගල යෝගය යනු කේනන්ද්‍රයේ කොතනක හෝ ශනි හෙවත් සෙනසුරු කුජ හෙවත් අඟහරු සමඟ සංයෝගව සිටීම හෝ සප්තවම සිටීමයි. මෙම සංයෝගය විවාහ අපේක්ෂිත දෙදෙනාගෙන් එක් අයෙකුගේ හෝ පිහිටීම අසුබ තත්ත්වයකි. දෘෂ්ටියකින් සම්බන්ධවීමද මෙම යෝගයට අයත් වෙයි. ශනි, කුජ දෙදෙනා විරුද්ධ ගති ගුණ ඇති නිසා මෙම ග්‍රහයින් දෙදෙනාගේ සංයෝගය ඔවුන්ගේ විවාහයට බොහෝ බාධාවක් වෙයි. මේ නිසා අසමගිය, හැරයාම, වැන්දඹුවීම, දික්කසාදවීම ආදියට හේතුවේ. එක් කේන්ද්‍රයක ශනි, මංගල යෝගය පිහිටා අනෙක් කේන්ද්‍රයේ එම යෝගය භංගවීමට අවශ්‍ය ග්‍රහ පිහිටීම නොතිබුණොත් රජ පවුලක වුවත් එම විවාහය බොහෝවිට අසාර්ථකවීමට හේතුවනු ඇත.

හිඹුටානේ
පියතිලක ද අල්විස්

කෙනකුගේ කේන්ද්‍රයේ ලග්නයේ සෙනසුරු, රාහු, කේතු, අඟහරු යන ග්‍රහයන්ගෙන් කීප දෙනකු හෝ එක් ග්‍රහයකු සිටියත් ඔහුගේ හෝ ඇයගේ යුගදිවියේ මිහිර වැඩිකලක් නොපවතියි. එසේම කේන්ද්‍රයේ හත්වැන්නේ රාහු, කේතු, අඟහරු යන පාපියකු සිටීමද විවාහය අවුල්කර දමන ග්‍රහ පිහිටීමක් වෙයි.



ඔබේ සම්පූර්ණ ජීවිතයම ඔය කේන්දරයේ සටහන් වෙලා තිබෙනවා

යමෙක් ස්වකීය වාසනාවන්තකම මත මෙලොව උපදින වෙලාව සිට මෙලොව හැර යන දිනයත්, ඒ දිනය අතරතුර කාලසීමාවේ සිදුවන හැම දෙයක්ම නිවැරදිව හදාගත් කේන්දරයේ නැත්නම් හඳහනේ ලියා තිබෙනවා. තරු – ග්‍රහලෝක ගැන හා ඒවායේ වෙනස්වීම්, විශ්වයේ පවතින තත්වයන් ඉන් අපට සිදුවන යහපත. ඒ වගේම අයහපත මෙහි ඇතුළත්. ඒක ඉතා ගැඹුරු විද්‍යාවක්.

> කෙනෙක් ස්වකීය වාසනාවන්තකම මත මෙලොව උපදින වෙලාව සිට මෙලොව හැර යන දිනයත්, ඒ දිනය අතරතුර කාලසීමාවේ සිදුවන හැම දෙයක්ම නිවැරදිව හදාගත් කේන්දරයේ නැත්නම් හඳහනේ ලියා තිබෙනවා. තරු – ග්‍රහලෝක ගැන හා ඒවායේ වෙනස්වීම්, විශ්වයේ පවතින තත්වයන් ඉන් අපට සිදුවන යහපත. ඒ වගේම අයහපත මේකේ ඇතුළත්.

දරුවකු උපන් වේලාව අනුව පැරණි පාරම්පරික ජ්‍යෝතිර්වේදියා චර තිර, උභය හා තවත් කරුණු පරීක්ෂාවට ලක් කරල කියනවා. ඒ වෙලාවට උපදින්න ඕනෑ. පිරිමි දරුවෙක්ද, ගැහැනු දරුවෙක්ද, එහෙමත් නැත්නම් සතෙක්ද බව. එහෙම ප්‍රකාශ කරල නියම කේන්දරය හදනවා. අපි මේ ක්‍රමයට කියනවා කේන්දරයක් සුද්ධ කරනවා කියලා. ඒ අනුව නියම ලග්නය – නවාංශකය, දසාංශකය. නිවැරැදිව හදල දෙනවා. ඒ අනුව හදන ජන්ම පත්‍රය තමයි ඉතාම නිවැරදි එක වන්නේ. නමුත් පරිගණකයෙන් හදන කේන්දරයේ ඔය එකක් වත් නැහැ. එහෙම කේන්දරයක් බලාගෙන කොහොමද නිවැරැදි පලාඵල කියන්නේ. මේ ආකාරයට කොම්පියුටරයෙන් හදන බොහෝ කේන්දරවල නවාංශකය වෙනස් වන්නෙ ඒකයි. ලග්නයට වඩා නවාංශකයෙන් ගුණාගුණ කියන එක වඩා සූක්ෂ මයි. වැරැදි නවාංශක දුන්නොත් කොහොමද නිවැරැදි පලාඵලයක් කියන්නේ අපි මේවා ටිකක් වටහා ගත්තොත් හොඳයි.

ජ්‍යොතිර්වේදියාගේ දක්ෂකම තමයි, රාශි 12ක ඇතුළත් ග්‍රහයෝ නම දෙනකුගෙන් යුත් රූප සටහනක් බලාගෙන අතීතයත්, වර්තමානයත්, අනාගතයත් ගැන පලාඵල කියන එක. මේක කරන්න නිවැරැදි කරුණු රාශියක් හිතේ තබාගෙන, මැණිකක් එක එක පැතිවලට හරව හරවා බලලා කරුණු අවබෝධ කරගන්නාසේ හොඳට පරීක්ෂා කරල කරන්න ඕනෑ දෙයක්. එහෙම පරීක්ෂා කරලා ඊට හේතුවත්, කෙරිය යුතු පිළියමත් දන්වන්ට ඕනෑ. මේ ප්‍රතිඵලය දැන්වීමට ජ්‍යෝතිෂයේ මූලික කරුණු, සිද්ධාන්ත, හෝරා නැකැත්, තිථි ආදිය ගැන හොඳ දැනීමක් තිබෙන්න ඕනෑ.

උදාහරණයක් වශයෙන් සෑම දිනකම එකම පොදු රාහු කාලයක් ලිතේ සඳහන් වුණාට එහෙම පවතින්නෙ නැහැ. තවත් ක්‍රමයකට කිව්වොත් හැම සඳුදාවකම රාහු කාලය උදේ 7.30 සිට 9 දක්වාම නොවේ. එක විනාඩි ගණනකින් වෙනස් වනවා. කොටින්ම කිව්වොත් බුද්ධාගම, ජ්‍යෝතිෂ ය ගැන කරුණු ඉගෙන ගත්තට වඩා අවබෝධ කර ගන්න එක වටිනවා. අපේ බුදු සාදු චූල පන්ථකට නිවන් අවබෝධ කර දුන්නෙ. කිසා ගෝතමියට නිවන් අවබෝධ කර දුන්නෙ ඒ විදියටමයි.

කිසියම් කෙනෙක් කේන්දරයක පලාඵල විස්තරයක් දැනගන්න ආවාට ඉස්සෙල්ල මුදල් ගැන කතා නොකර ඔවුන්ගේ ප්‍රශ්න ටික. ජ්‍යෝතිර්වේදියා වටහාගත යුතු වනවා. ඊට පසු ඒවා ඔවුන්ට වටහා දීලා අවශ්‍ය නම් පිළියම් කියාදීම ඔහුගේ යුතුකම වනවා.

කෙනෙකුගේ ලග්නය කිව්වේ ජන්මියා මෙලොව උපදින කොට නැඟෙනහිර ක්ෂිතිජයෙන් උදාවන රාශියට. ඒ වටා රාශින් 12ක් ගමන් කරනවා. ඒ රාශින්ට අයත් ග්‍රහලෝක 9ක් පවතිනවා. ඒ ඒ ග්‍රහයින් එක එක රාශින්ට වෙනස් විදියට බලපානවා. මේ එක රාශියක පරතරය අංශක 30ක් වනවා. මේ සරල කරුණුවත් නොදත් සමහර අය ජ්‍යෝතිෂය කරන බව මම වගකීමෙන් කියනවා. අපි හොඳට දන්න කරුණක් තමයි වර්තමානයට වඩා අතීතයේ හිටි ජ්‍යෝතිර්වේදියා දක්ෂ බව. ඒ කිසිවෙකුත් පරිගණකය පාවිච්චි කළේ නැහැ. නමුත් පරිගණකයට වඩා සූක්ෂම මොලේ පාවිච්චි කළා. ජ්‍යෝතිෂ කරුණු, සිද්ධාන්ත දැන හිටියා. දැන් අය බොහෝ දුරට ශාස්ත්‍රයට වඩා සූස්තරය පාවිච්චි කරනවා.



ඉස්සර සිට පැවතෙන කතාවක් තමයි ඕනෑම කෙනකුගේ හතර කේන්දරය පාළුනම් මහණ කමට හැර වෙන කිසිවක් කරන්ට බැහැ කියන එක. ඒක ලොකුම මුසාවක්. හතර කේන්දරය පාලු එක මහණ යෝගයක් නොවේ.

මහණවන්න මහණ යෝග තිබෙන්න ඕනෑ. වැඩිපුරම මහණ යෝගය කිව්වේ කේන්දරයක 5 - 9 රාශි සම්බන්ධ කරගෙන බව දැනගන්න. කේන්දරයක ශනි, සඳු, සිකුරු එකට හිටියොත් නැත්නම් යෝග වුණොත් බලවත් මහණ යෝගයක් ඒකෙනුත් 4 -7- 9 පිහිටියොත් ඉතා බලවත් වනවා. මේවා යෝග පිහිටීම්.

අපේ සියලුම වගතුග මේ කේන්දරයේ සටහන්වෙලා තිබෙනව කියල කිව්වනේ. ඒක උදාහරණයක් සමඟ බලාගනිමුද? උදාහරණයකට මේෂ ලග්නය ගනිමු.

මේ රූපයේ පෙනෙන අයුරු ලග්නය අයිතිකාරයා අඟහරුවා. එයාට අයිති පළමු රාශිය හා 8 වැනි රාශිය. ඊළඟට සිකුරුට අයිති වන්නෙ 2 වැනි හා 7 වැනි රාශි වෙනවා. බුධට අයිති වන්නෙ 3 හා 6 වන අතර, ගුරුට අයිති 9 හා 12 රාශියයි.

සෙනසුරුට 10,11 රාශි වන අතර, සඳුට හා රවිට 4 හා 5 රාශි අයිති වනවා.මෙම පිහිටීම උඩ ඔබේ කේන්දරයට අනුව ඒ වෙලාවට බලපාන්නෙ කොහොමද කියලත් දැනගන්න ඕනෑ. එහෙනම් මේ ශ්ලෝකයට ආදේශ කර බලාගමු. ලග්න ස්ථාන 1 – ධනස්ථාන 2, සහජ 3, බන්දු 4, ප්‍රියඃ ශුභ 5 – ශත්‍රුඃ 6 – කලත්‍රංච 7 , මුත්‍රංච 8 – ධර්ම 9, කර්ම 10 – අයඃ 11 – වැයඃ 12

ඔබේ තත්කාල කේන්දරයට අනුව මහ දසාව හා අතුරු දසාව ගෙවන්නෙ කාටද කියල බලාගෙන ඒ රාශියට ග්‍රහයාගේ බලපෑම බලාගෙන ප්‍රතිඵල දැනගන්න ඒ වගේම උත්පත්ති කේන්දරයේ ග්‍රහ පිහිටීම මත ලැබෙන්නෙ නියත ප්‍රතිඵල වුණාට තත්කාල කේන්දරයට අනුව අනියත ග්‍රහ බලපෑම් ද ඇති වනවා. ඔය අඟහරුවා තත්කාල කේන්දරයේ 6 -9 වැනි රාශිවලට හෝ 11 වැනි රාශියේ නපුරට පිහිටියොත් ඒ පිහිටීම ජන්මියාට සුබදායක වන්නේ නැහැ. ඒ වගේම රවි තත්කාල කේන්දරයේ නපුරට පිහිටියොත් තත්ත්වය නරකයි. රවි ඔළුවේ ස්නායු වලට අධිපතියා. අංශභාගේ හදන්නෙ මෙයා.

ඔබගේ පුතා හෝ දුව පාසැල් යන වයසේදී විශේෂයෙන්ම අපොස විභාග ගන්නා කාලයට ගුරු මහ දසාවේ සිකුරු අතුරු හෝරාව ආවෝත් කිසියම් ආදරබර ඇසුරක් ඇති කරලා ඉගෙනීම කඩනවා. කසාද බදින වයසේ නම් සිකුරු මහ දසාවේ ගුරු අතුරු හෝරාව නම් ඉගෙනීම සම්බන්ධව මොකක් හරි ගෙනල්ලා විවාහයට බාධා ඇති කරනවා. මේ දෙකටම පිළියම් හදන විට වෙන්න ඕන දේ වෙලා ඉවරයි. මොකද ගුරු ශුක්‍රෝ සදා වෛරඃ කියලයි ශ්ලෝකයේ තිබෙන්නේ.

සෙනසුරු ගැනත් ටිකක් කියන්නද? සෙනසුරු ඕනෑම හොඳ දේවල් හැම එකක්ම වගේ ප්‍රමාද කරනවා. ප්‍රමාද කරලා ඒක කරදෙනවාමයි. විශේෂයෙන් විවාහය අනික සෙනසුරු තරම් දෙන ග්‍රහයෙක් මේ සෞරග්‍රහ වළල්ලේ නැහැ. හැබැයි දෙන්න ගත්තාම ඕන කරන එකයි එපා කරන එකයි දෙකම දෙනවා. අර එපා කරන ඒවා ගත්තාට අපි ඉබේටම නරක් වනවා. අන්ත දුගී තත්ත්වයටම පත්වනවා. එනිසා අපිට මොනවා හරි ලැබෙන කොට අවශ්‍ය දේ විතරක් රැගෙන එපා දේ ප්‍රතික්ෂේප කරන්න සෙනසුරුගෙන් ඉගෙන ගන්න.

ඕනෑම කේන්දරයක 2,5,8,11 තිර රාශි බව දන්නවනේ . එහෙනම් මේ තිර රාශියකට අයිති ග්‍රහයෙක් ධර්ම – කර්ම ස්ථානවල දුර්වල වුණොත් ඔබ රජෙක් වුණත් මැරෙන්න ඔබට අයිති නැති ස්ථානයක් වන රෝහලක අනාථ මැදුරක, එහෙමත් නැතිනම් පාළු බස් නැවතුමක බව දැනගත්තොත් හොඳයි.

පාරම්පරික ජ්‍යෝතිෂවේදී /ගුප්ත විද්‍යාධර
මීපේ ගණිතගේ
රන්ජිත් විද්‍යාරත්න

නිවෙසක් ඉදිකිරීමට භූමිය තෝරා ගැනීමේ දී මේ ගැනත් සැලකිලිමත් වන්න

ඔබ කුමන තරාතිරමක අයකු වුවද නිවෙසක් ඉදිකර ගැනීමට භූමිය තෝරා ගැනීමේ දී ඒ පිළිබඳ මෙසේ අවධානයට ලක්කළ යුතු ය. මෙහිදී පළමුවෙන්ම ඔබ සිතිය යුතු වන්නේ නිවෙස ඉදිකරන ප්‍රදේශය තෝරා ගැනීමේ දී තමාට එදිනෙදා කටයුතුවලට පහසු යහපත් ප්‍රදේශයක් වීමයි.

එයින් අදහස් කළේ එම ප්‍රදේශය තුළ වෙළඳ පහසුකම්, ආරෝග්‍යශාලා පහසුකම්, අධ්‍යාපන පහසුකම් මාර්ග පහසුකම්වලට අමතරව සොරබිය නැතිවීම, නූගතුන් වෙසෙන ප්‍රදේශයක් නොවීම මෙන්ම ජලයෙන්, කඳු සහිත ප්‍රදේශවලින් සිදුවන ආපදාවලින් බැහැර ප්‍රදේශයක් වීමයි.

මීට අමතරව ජන්මියාගේ දෛවයට ගැළපෙන ප්‍රදේශයක, නගරයක, බිමක් තෝරා ගැනීමට උනන්දු විය යුතුයි. මේ සඳහා ගෙය ගොඩනඟන්නාගේ ජන්ම නැකතට හෝ අභිදාන නැකතට ගැළපෙන අයුරින් ප්‍රදේශය තෝරා ගැනීමට වගබලා ගත යුතුයි. නූතනයේ ඉඩම් හිඟයක් ඇතත් මේ සියලුම ගුණාංගයන්ගෙන් යුත් ඉඩමක් සෙවීම අසීරු වුවද, කෙසේ හෝ ලැබුණ ඉඩම වාස්තු විද්‍යානුකූලව දෝෂ රහිතව සකස් කර ගත හැකිනම් එය නිවෙසේ අඩිතාලම තරම්ම වැදගත් ය.

මෙහිදී ඉඩමේ හැඩය බෑවුම, පස මෙන්ම ඉඩම තුළ වෘක්ෂලතා වැවෙන තත්ත්වය මතද සුදුසු ඉඩම තෝරා ගැනීමට ද නිවාස ඉදිකරන්නන්ට මං පෙත් විවර කිරීමටත් මෙම විද්‍යාව ආරම්භක සාධකයකි.

නිසි බිමක් සොයන තවත් ක්‍රමයකි වර්ණය අනුව වර්ග කිරීම. සුදු, රතු, කහ, කළු යන පාටින් ඇති බිම් යහපත් භූමි බවයි. අද බොහෝ කටයුතුවලදී රතු පස් උපයෝගී කර ගැනීමෙන් පෙනී යන්නේ ඉපැරැණි තාක්ෂණය නූතන තාක්ෂණයේ ක්‍රමවේදයක් බවයි.

එසේම ඉඩම තෝරා ගැනීමේ දී තමා ජීවත්වන පරිසරයට සමීපව නොතිබිය යුතු අංග මොනවාදැයි යනුවෙන් ද විමසා බැලිය යුතුයි. සොහොන් පිටියක් හෝ වනාන්තරයක් අසල නොවිය යුතු අතර, නාය යා හැකි කඳු බෑවුම්, පිටාර ගලන ගංගා ඇළ දොළ මෙන්ම විශාල ගල්පර ඇති ස්ථානයන්ගෙන් ඈත්ව විසීම වඩාත් සුවදායකය. තවද සතුන් බහුලව ඇතිකරන ස්ථාන, සතුන් ඝාතනය කරන ස්ථාන, මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කරන ස්ථාන මෙන්ම විශාල කර්මාන්ත ශාලා මෙන්ම නූගත් පිරිස් වාසය කරන ස්ථාන පිළිබඳවද විමසිලිමත් වීම වැදගත් වේ.

එසේම මේ කරුණුවලට අමතරව තවත් විශේෂයෙන් සොයා බැලිය යුතු කරුණු කීපයක්ද වෙයි. පදිංචියට තෝරා ගනු ලබන ඉඩමේ ඔප්පුව නිරවුල් පැහැදිලි එකක් විය යුතුයි. නිරවුල් මායිම් සහිත වීම මෙන්ම, ඉඩම ත්‍රිකෝණාකාර එකක් ද නොවිය යුතු ය. ඉහත සඳහන් කරුණු සෑම එකක්ම යහපත් යැයි සිතුවද ජ්‍යෝතිෂ්‍යානුකූලව තමන් පදිංචියට තෝරා ගන්නා ප්‍රදේශය සුබදායකද කියා සලකා බැලිය යුතු ය. මේ සඳහා නිවෙස ඉදිකරන්නන්ගේ ජන්ම නැකතට ගැළපෙන අයුරින් ප්‍රදේශය තෝරා ගන්න.

වාස්තු විද්‍යාවේදී,

සුනිල් කුමාර වත්තගේ

සටහන -

ධම්මිකා රාජපක්ෂ

අටවන භාවය



ජන්ම කේන්ද්‍රයේ අටවැනි කොටුව හෙවත් අටවැනි භාවය මාරකස්ථානය, රන්ධ්‍රස්ථානය ආදී නම්වලින් හඳුන්වයි. මරණය සිදුවන ආකාරය අටවැනි භාවයෙන් බැලිය යුතු වේ. විවාහයෙන් ලැබෙන දායාද හවුල් ව්‍යාපාරවලින් ලැබෙන ලාභ, මියගිය අයගෙන් ලබන ධනය අටෙන් බැලිය හැකි වේ.

කේන්ද්‍රයේ අටවැන්න දුෂ්ටස්ථානයක් වශයෙන් හඳුන්වයි. 6, 8, 12 යන රාශි තුන දුෂ්ටස්ථාන වශයෙන් හඳුන්වන අතර එයින් නරකම ස්ථානය ලෙස අටවැන්න පිළිගනී. මරණය, මරණ දුක මරණයට හේතු සම්බන්ධ සියලු විස්තර අටවැන්නෙන් කියවේ.

අට වැන්නත් හය වැන්නත් දුෂ්ට රාශීන් වේ. එම ස්ථානවල පාප ග්‍රහයන් සිටි විට එය හත් වැන්නට ශුභ නොවේ. එය විවාහයට ද පීඩා ඇති කළ හැකි වේ. හත්වැන්නෙන් දෙවැන්න අටවැන්න වන බැවින් විවාහයෙන් ලැබෙන දායාද පිළිබඳව ද අටවැන්නෙන් බැලිය හැකි වේ. එමෙන්ම හත්වැන්නෙන් දෙවැන්න අටවැන්න වන බැවින් හවුල් ව්‍යාපාරවලින් ලැබෙන ලාභ පිළිබඳවද අට වැන්නෙන් බැලිය හැකි වේ.

අටවැන්න අශුභ ඵලදීමේ ප්‍රමුඛස්ථානය වේ. එබැවින් දුක්කරදර සිත් තැවුල්, බලවත් දුක් පීඩා, ධන විනාශය, නොයෙක් විපත්, වේදනාකාරී දේවල්, අනතුරු, ගුප්ත මරණ ආදිය අටෙන් දැක්වේ.

ශරීරයේ රහස් ප්‍රදේශ අටට අයිති වේ. ඒවායේ රෝග සම්බන්ධවද අටෙන් කිව යුතු වේ. අට වැන්නේ සිටින ග්‍රහයාත්, අට අධිපති ග්‍රහයාත් සිටින තැන අනුවත් ග්‍රහයන්ගේ බලදුබලතාත් බැලිය යුතු වේ.

පස්වැන්නෙන් හතර වැන්න අට වැන්න වන බැවින් පුතාගේ ගේ දොර ඉඩකඩම්, යාන වාහන පිළිබඳවද අටවැන්නෙන් බැලිය හැකි වේ. එමෙන්ම පියාගේ වියදම, ස්ථාන හැරයාම පිළිබඳවද බැලිය හැකි වේ.

රවි ග්‍රහයා අටට එතරම් ශුභ නොවේ. නිතර දුක්කරදර ඇති වේ. ලෙඩ රෝග පහසුවෙන් සෑදේ. සඳු ග්‍රහයා ද අටට ශුභ නොවේ. සෙම් රෝග හිතේ කනස්සලු ගති ඇති කරයි. කුජ ග්‍රහයාද අටට එතරම් ශුභ නොවේ. හදිසි අනතුරු ඇතිවිය හැකිය. ශල්‍යකර්මවලට මුහුණ පෑමට සිදුවේ. වස්තුව අඩු කරයි. අටට තරමක් ශුභ ග්‍රහයා බුධ වේ. ශරීරය දීප්තිමත් කරයි. ගුරු අටේ සිටි විට වැඩිහිටි ඥාතීන්ගෙන් දේපළ ලැබේ. විවාහයෙන් දේපළ ලැබීමටත් ඉඩ තිබේ. අටට සිකුරු ග්‍රහයා ශුභ වේ. රූප ශෝභාව ඇතිවේ. ශනි ග්‍රහයා අටට ශුභ නොවේ. දරුණු ලෙඩ රෝගවලට මුහුණ පාන්න සිදුවේ. නින්දා අපහාස ලැබේ. රාහු අටේ සිටි විට උෂ්ණ රෝග සාදයි. වස්තුව හානි කරයි. කේතු ග්‍රහයා අටේ සිටි විට නොයෙක් ලෙඩ රෝගවලට මුහුණපාන්න සිදුවේ.

අටේ සිටින සෑම ග්‍රහයෙක්ගේම බල දුබලතා අනුව ශුභ අශුභ ඵල ලබා දේ. අටවැන්න අශුභ ඵලදීමේ මූලික ස්ථානය වේ. එබැවින් අටේ ග්‍රහයෙකු නැති තරමට හොඳ වේ.

චතුරිකා දිල්හානි ගමආරිය

විවාහයට ගිනි තියන කාමගින්න

ආදිවාසි ගල් යුගයේ ස්ත්‍රිය හා පුරුෂයා එකම ගුහාවක් තුළ අඹුසැමියන් ලෙස ආදරයෙන්, සොම්නසින්, ප්‍රේමයෙන් එකිනෙකා අවබෝධාත්මකව දරුවන් බිහිකර සොබාදහමට එකඟව ජීවත් වූහ.

එදා ඔවුන් අතර දික්කසාදයක් සිහිනෙකින්වත් නොවූ වගත් අද වන විට දික්කසාදය නොව කෙටි කසාදයකට නතු වී ඇත. අදටත් මහ වන්නියේ සහ උඩරට විවිධ ප්‍රදේශවල පවුල් ජීවිත ගෙවන්නේ නිත්‍යනුකූලව මුද්දරයක් මත සිය අත්සන් හංවඩුව තබා නොවේ.

එඬරු නැට්ටේ කිරිවලින් පෙම් පත කඩදාසි කොළයක ලියා දැල්වෙන ලාම්පු චිමිනිය මත එම කඩදාසි කොළය ඇල්ලූ විට ආදර පෙම් අකුරු උඩට මැවී පෙනින. එවන් සෞන්දර්යාත්මක පෙම්පත් හුවමාරුව අද වන විට ස්මාට්ෆෝන් (අත්බණුව) භාර ගෙන තිබේ. තාක්ෂණයේ ඉහළම දියුණුවට පා තබා ඇති මෙවන් කාලපරාසය තුළ පෙම් ලොව අතරමං වී උන්මත්තකයින් ලෙස හැසිරෙන අයුරු දැකිය හැකිය. ඇතැම් සුරූපී තරුණියන් සිය නග්න රුව දුරකතනයේ තිරයේ දසුන් මවා වෙළෙඳ පොළ සමඟ ගනුදෙනු කරන අන්දම ද වඩාත් පැහැදිලිය.

එක් තරුණ අඹු සැමි යුවළක් ඉතාම සතුටින්, සාමයෙන් ජීවත්වන අතරතුර වෙනත් මැදිවියේ කාන්තාවක් සමඟ හාදවීමේ අවසන් ප්‍රතිඵලය වූයේ දැඩි ලෙස ඇයට පහර දීමය. පොරොන්දම් ලකුණු 36ම ගැළපුණත් යහපත් සුබ ධනාත්මක ග්‍රහ හැසිරීමේ රටාවක් ඇතත් වත්මන්හි දෙපක්ෂයේම මනසට සෑම නිමේෂයකම කාමය එන්නත් කරන බව නම් පැහැදිලිය. තාක්ෂණයේ දියුණුව මිනිසා ළඟා කර ගන්නවාද නැත්නම් තමා

තමා විසින්ම වැනසෙනවාද යන්න මනා සිහියෙන් කල්පනා කළ යුතු වන්නේය. පැරණි කාලයේ සිය සැමියා ගෙයින් පිටතට ගිය කල සොර හිමියෙකු ගෙට ගෙන්වා කාමගින්න නිවා ගන්නා විට සිය සැමියා පෑල දොරින් ගෙට ඇතුළුවන මොහොතේම අළුකුල්ලකින් මුහුණට දමා ගසන්නීය. අද වන්නේ සිය සැමියාට නිදිපෙත්ත කෝප්පයකට දමා එය පිළිගන්වා තම අරමුණ වහා ඉටුකර ගන්නා තැනට පත්වීමකි. තවද සමහර සැමියන් තෙවැනි සිල්පදය ඇති තරම් රහසේ කඩමින් බිරිඳගෙන් අසන්නේ තමුසෙ කහ මලෙන් නෑවාද කියාය. සැකය මුල්වී ඇත. සිය බිරිඳ රූමත්නම් සැකය තව තවත් දළුලා වැඩේ.

දෙන්නට දෙන්නාගේම සැකය තුඩුදීම නිසා මේ වන විට විවාහය දෙදරා යන තැනට පත්වී තිබේ. දැන් දැන් ඔළුවේ ගෑවී ඇති රාගය මුළු ඇඟේම තැවරී බින්න බැස ඇත්තේය. වසරකින්, හය මසකින්, මාසයෙන් පමණක් නොව සතියෙන් දික්කසාදයට යන තැනට මග පෑදී හමාරය.

දසුන් හා කටහඬ ලෝචන, දර්ශන ස්පර්ශ, පීඩන ක්‍රෑර, වැනි කාම රෝගී තත්ත්වයට පත් වී ඇත්තේ ඇයි. එදා කාලිදාසයන් මේඝදූතය වැනි කාව්‍ය රචනා කර ඇත්තේ වලාකුළකින් පෙම් පණිවුඩ මුදාහැරීමටයි. අද පෝන් තිරයේ කටහඬත් රූපයත් අසන දකින තැනට පත් වී තිබීම හරියට කාම කොවුලන්ට අඹ දලු දැකීමක් වැනිය.

ජ්‍යෝතිෂවේදී

හෙන්රි බෙම්මුල්ල

සතියේ පඤ්චාංගය

ශක වර්ෂ 1944 ක් වූ මීන රවි 03 භාග මැදින් අව දසවක තිථිය ලත් කිවිදින සිට එම රවි 09 භාග බක් පුර දියවක ලත් ගුරු දින දක්වායි.

ග්‍රහයෝ සහ රාශි

රවි - මීන
කුජ - මිථුන
බුධ - මීන
ගුරු - මීන
ශුක්‍ර - මේෂ
ශනි - කුම්භ
රාහු - මේෂ
කේතු - තුලා
යුරේනස් - මේෂ
නැප්චූන් - මීන

ග්‍රහයෝ සහ නැකැත්

රවි - පුවපුටුප (18 දවල් 02.53 උත්‍රපුටුප)
කුජ - මුවසිරස
බුධ - පුවපුටුප(18දා අලුයම 03.45 උත්‍රපුටුප)
ගුරු - රේවතී
ශුක්‍ර - අස්විද
ශනි - සියාවස
රාහු - අස්විද
කේතු - සා
යුරේනස් - බෙරණ
නැප්චූන් - පුවපුටුප

පෝය

මාර්තු 21 අඟහරුවාදා අලුයම 01.50න් අමාවක ලබා එදිනම රාත්‍රී 10.57න් ගෙවේ. 21 අඟහරුවාදා සිල්.

චන්ද්‍ර චාරය

17 දා උදේ 10.18 මකර
19 දා දවල් 11.18 කුම්භ
21 දා දවල් 12.01 මීන
23 දා දවල් 12.14 මේෂ

දින තත්ත්වය

මාර්තු 17 සිකුරාදා
මීන රවි 03 භාග මැදින් අව දසවක තිථිය ලත් කිවිදින. ඉර උදාව 06.17. ඉර බැසීම 06.22. පුවසල නැකත අලුයම 04.47න් ගෙවී උත්‍රසල නැකත ලබයි. මැදින් අව දසවක තිථිය දහවල් 02.06න් ගෙවී අව එකොළොස්වක තිථිය ලබයි. වාරියන් යෝගය උදේ 06.59න් ගෙවී පරිඝ යෝගය ලබයි. වණිජ කරණය අලුයම 03.27න් ගෙවී විෂ්ටි කරණය ලබා දහවල් 02.06න් ගෙවී බව කරණය උදාව පවතී.
විෂ කලාව - මාපටැඟිලි
අමෘත කලාව - පෙකණිය මරු - ගිනිකොන
යෝගිනී - උතුර සුබ දිසාව - නැගෙනහිර

මාර්තු 18 සෙනසුරාදා
මීන රවි 04 භාග මැදින් අව එකොළොස්වක තිථිය ලත් ශනිදින. ඉර උදාව 06.16. ඉර බැසීම 06.22. උත්‍රසල නැකත අලුයම 02.46න් ගෙවී සුවන නැකත ලබයි. මැදින් අව එකොළොස්වක තිථිය දහවල් 11.14න් ගෙවී අව දොළොස්වක තිථිය ලබා පවතී. පරිඝ යෝගය අලුයම 03.33න් ගෙවී ශිව යෝගය ලබා එය රාත්‍රී 11.53න් ගෙවී සිද්ධ යෝගය ලබයි. බව කරණය අලුයම 12.42න් ගෙවී බාලව කරණය ලබා එය දහවල් 11.14න් ගෙවී කෞලවකරණය උදාවී එදින රාත්‍රී 09.42න් ගෙවී තෛතිල කරණය උදාව පවතී.
විෂ කලාව - පතුල
අමෘත කලාව - ලිංග / යෝනි
මරු - නැගෙනහිර යෝගිනී - ගිනිකොන
සුබ දිසාව - දකුණ

මාර්තු 19 ඉරිදා
මීන රවි 05 භාග මැදින් අව දොළොස්වක තිථිය ලත් රවි දින. ඉර උදාව 06.16. ඉර බැසීම 06.21. සුවන නැකත අලුයම 12.29න් ගෙවී දෙනට නැකත ලබා එය රාත්‍රී 10.05න් ගෙවී සියාවස නැකත උදා වෙයි. මැදින් අව දොළොස්වක තිථිය උදේ 08.09න් ගෙවී අව තෙළෙස්වක තිථිය ලබා පවතී. සිද්ධ යෝගය රාත්‍රී 08.07න් ගෙවී සාධ්‍ය යෝගය ලබයි. තෛතිලකරණය උදේ 08.09න් ගෙවී ගරජකරණය ලබා එය සවස 06.33න් ගෙවී වණිජකරණය උදාව පවතී.
විෂ කලාව - කෙන්ඩ
අමෘත කලාව - දණහිස මරු - උතුර
යෝගිනී - නිරිත සුබ දිසාව - දකුණ

මාර්තු 20 සඳුදා
මීන රවි 06 භාග මැදින් අව තෙළෙස්වක තිථිය ලත් සඳු දින. ඉර උදාව 06.15. ඉර බැසීම 06.21. සියාවස නැකත රාත්‍රී 07.42න් ගෙවී පුවපුටුප නැකත ලබයි. මැදින් අව තෙළෙස්වක තිථිය අලුයම 04.57න් ගෙවී අව තුදුස්වක තිථිය ලබා පවතී. සාධ්‍ය යෝගය සවස 04.22න් ගෙවී ශුභ යෝගය ලබයි. වණිජ කරණය අලුයම 04.57න් ගෙවී විෂ්ටිකරණය ලබා එය සවස 03.23න් ගෙවී ශකුණකරණය උදාව පවතී.
විෂ කලාව - ලිංග, යෝනි, පෙකණි
අමෘත කලාව - පතුල, මාපටැඟිලි
මරු - වයඹ යෝගිනී - දකුණ
සුබ දිසාව - නැගෙනහිර

මාර්තු 21 අඟහරුවාදා
මීන රවි 07 භාග මැදින් අව අමාවක තිථිය ලත් කුජදින. ඉර උදාව 06.15. ඉර බැසීම 06.21. පුවපුටුප නැකත සවස 05.30න් ගෙවී උත්‍රපුටුප නැකත ලබයි. මැදින් අව තුදුස්වක තිථිය අලුයම 01.50න් ගෙවී අව අමාවක තිථිය ලබා පවතී. ශුභ යෝගය දහවල් 12.44න් ගෙවී ශුභ්‍ර යෝගය ලබයි. ශකුණකරණය අලුයම 01.50න් ගෙවී චතුෂ්පාද කරණය ලබා දහවල් 12.22න් ගෙවී නාගකරණය ලබා එය රාත්‍රී 10.57න් ගෙවී කිංස්තුංගකරණය උදාව පවතී.
විෂ කලාව - පෙකණිය
අමෘත කලාව - මාපටැඟිලි මරු - බටහිර
යෝගිනී - ඊසාන සුබ දිසාව - නැගෙනහිර

මාර්තු 22 බදාදා
මීන රවි 08 භාග බක්පුර පෑලවිය තිථිය ලත් බුධ දින. ඉර උදාව 06.14. ඉර බැසීම 06.21. උත්‍රපුටුප නැකත සවස 03.37න් ගෙවී රේවතී නැකත ලබයි. බක් පුර පෑලවිය තිථිය රාත්‍රී 08.27න් ගෙවී පුර දියවක තිථිය ලබා පවතී. ශුභ්‍ර යෝගය උදේ 09.20න් ගෙවී බ්‍රහ්ම යෝගය ලබයි. කිංස්තුංගකරණය උදේ 09.38න් ගෙවී බවකරණය ලබා එය රාත්‍රී 08.27න් ගෙවී බාලවකරණය උදාව පවතී. විෂ කලාව - ළැම
අමෘත කලාව - මාපටැඟිලි මරු - නිරිත
යෝගිනී - නැගෙනහිර සුබ දිසාව - උතුර

මාර්තු 23 බ්‍රහස්පතින්දා
මීන රවි 09 භාග බක් පුර දියවක තිථිය ලත් ගුරු දින ඉර උදාව 06.14. ඉර බැසීම 06.21. රේවතී නැකත දහවල් 02.14න් ගෙවී අස්විද නැකත ලබයි. බක් පුර දියවක තිථිය සවස 06.28න් ගෙවී පුර තියවක තිථිය ලබා පවතී. බ්‍රහ්ම යෝගය උදේ 06.17න් ගෙවී මහේන්ද්‍ර යෝගය ලබයි. බාලවකරණය උදේ 07.20න් ගෙවී කෞලවකරණය ලබා එය සවස 06.28න් ගෙවී තෛතිලකරණය උදාව පවතී.
විෂ කලාව - තනය අමෘත කලාව - පතුල
මරු - දකුණ යෝගිනී - උතුර
සුබ දිසාව - නැගෙනහිර

සතියේ ලග්න උදව

	මේෂ උදේ	වෘෂභ	මිථුන	කටක සවස	සිංහ	කන්‍යා	තුලා රාත්‍රී	වෘශ්චික	ධනු	මකර	කුම්භ	මීන උදේ
17 ශු	07.58	09.52	11.54	02.06	04.10	06.10	08.04	10.06	12.16	02.28	04.26	06.12
18 ශ	07.54	09.48	11.50	02.02	04.06	06.06	08.00	10.02	12.12	02.24	04.22	06.08
19 ර	07.50	09.43	11.46	01.58	04.02	06.02	07.56	09.58	12.08	02.20	04.18	06.04
20 ච	07.45	09.38	11.42	01.52	03.58	05.56	07.50	09.52	12.02	02.15	04.12	05.59
21 කු	07.41	09.34	11.38	01.48	03.54	05.52	07.45	09.48	11.58	02.10	04.08	05.55
22 බු	07.37	09.30	11.34	01.44	03.50	05.48	07.41	09.44	11.54	02.06	04.04	05.51
23 ගු	07.33	09.26	11.30	01.40	03.45	05.44	07.37	09.40	11.50	02.02	04.00	05.47

කාල හෝරාව ගෙවී යන අයුරු

17 ශු	ශු 06.17	බු 07.17	ච 08.17	ශ 09.17	ගු 10.17	කු 11.17	ර 12.17	ශු 01.17	බු 02.17	ච 03.17	ශ 04.17	ගු 05.17	කු 06.17
18 ශ	ශ 06.16	ගු 07.16	කු 08.16	ර 09.16	ශු 10.16	බු 11.16	ච12.16	ශ 01.16	ගු 02.16	කු 03.16	ර 04.16	ශු 05.16	බු 06.16
19 ර	ර 06.16	ශු 07.16	බු 08.16	ච 09.16	ශ 10.16	ගු 11.16	කු 12.16	ර 01.16	ශු 02.16	බු 03.16	ච 04.16	ශ 05.16	ගු 06.16
20 ච	ච 06.15	ශ 07.15	ගු 08.15	කු 09.15	ර 10.15	ශු 11.15	බු 12.15	ච 01.15	ශ 02.15	ගු 03.15	කු 04.15	ර 05.15	ශු 06.15
21 කු	කු 06.15	ර 07.15	ශු 08.15	බු 09.15	ච 10.15	ශ 11.15	ගු 12.15	කු 01.15	ර 02.15	ශු 03.15	බු 04.15	ච 05.15	ශ 06.15
22 බ	බු 06.14	ච 07.14	ශ 08.14	ගු 09.14	කු 10.14	ර 11.14	ශු 12.14	බු 01.14	ච 02.14	ශ 03.14	ගු 04.14	කු 05.14	ර 06.14
23 ගු	ගු 06.14	කු 07.14	ර 08.14	ශු 09.14	බු 10.14	ච 11.14	ශ 12.14	ගු 01.14	කු 02.14	ර 03.14	ශු 04.14	බු 05.14	ච 06.14

නිරයන ග්‍රහස්ඵුට

	රවි මීන	සඳු ධනු	කුජ මිථුන	බුධ මීන	ගුරු මීන	ශුක්‍ර මේෂ	ශනි කුම්භ	රාහු මේෂ	යුරේනස් මේෂ	නැප්චූන් මීන
17 ශු	01.58.08	27.23.32	01.50	01.33	21.22	05.55	06.55	12.03	21.56	00.59
18 ශ	02.57.54	මකර 11.57.47	02.17	03.31	21.37	07.07	07.02	12.00	21.59	01.01
19 ර	03.57.37	26.43.24	02.45	05.30	21.51	08.20	02.08	11.57	22.01	01.04
20 ච	04.57.18	කුම්භ 11.33.37	03.13	07.29	22.05	09.32	07.15	11.53	22.04	01.06
21 කු	05.56.58	26.20.29	03.41	09.29	22.19	10.44	07.22	11.50	22.06	01.08
22 බු	06.56.36	මීන 10.56.00	04.10	11.30	22.33	11.56	07.29	11.47	22.09	01.10
23 ගු	07.56.11	25.13.20	04.38	13.31	22.48	13.08	07.35	11.44	22.12	01.13

සැකසීම
සංජීව
අඹුවන්ගල

බබාගේ නමට අකුරු

මාර්තු 17 සිකුරාද සිට මාර්තු23 වන බ්‍රහස්පතින්ද දක්වා වූ සතිය තුළ දී උපදින දු පුතුන් හට සුබ නාමාක්ෂර පහත පරිදි ගළපා නම් තබන්න.

17 කිවිද

අලුයම 04.47 දක්වා පුවසල නැකත උදාව පවතින බැවින් නම් තැබීමට බූ, ධ අකුරුත් ඉන්පසුව උදාවන උත්‍රසල නැකතට හිමිවන බෙ, බො, ජ, ජී අකුරුත් දිනයට සුදුසු වන ච, ඡ, ජ අක්ෂරත් සුබදායකයි.

18 ශනිද

මෙදින අලුයම 02.46 දක්වා උත්‍රසල නැකත පවතින නිසා නම් තැබීමට බෙ, බො, ජ, ජී අකුරු හා ඉන්පසුව උදාව පවතින සුවන නැකතට හිමිවන ජු, ජෙ, ජො, ෂ අකුරුත් දිනයට සුදුසුවන ප, බ, භ, ම අක්ෂරත් ගළපා නම් තබන්න.

19 රිවිද

මෙදින අලුයම 12.29 දක්වා සුවන නැකත උදාව පවතින නිසා ජු, ජෙ, ජො, ෂ අකුරු හා එතැන් පටන් රාත්‍රී 10.05 දක්වා දෙනට නැකත පවතින නිසා ග, ගි, ගු, ගෙ අකුරුත් දිනයට සුදුසු වන අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඒ, ඔ, ඕ අක්ෂර සුබදායකයි.

20 සඳුද

මෙදින රාත්‍රී 07.42 දක්වා සියාවස නැකත උදාව පවතින බැවින් නම් තැබීමට ගො, ස, සි, සු අකුරුත් ඉන්පසුව උදාවන පුවපුටුප නැකතට හිමිවන සෙ, සො, ද, දි අකුරුත් දිනයට සුදුසු ය, ර, ල, ව, ස, හ, ශ, ෂ අකුරුත් ගළපා නම් තබන්න.

21 කුජද

මෙදින සවස 05.30 දක්වා පුවපුටුප නැකත උදාව පවතින නිසා සෙ, සො, ද, දි අකුරු හා ඉන්පසුව උදාවන උත්‍රපුටුප නැකතට හිමිවන දු, ථ අකුරුත් දිනයට සුදුසු වන ක, ඛ, ග, ඞ අක්ෂරත් සුබදායකයි.

22 බුධද

මෙදින සවස 03.37 දක්වා උත්‍රපුටුප නැකත උදාව පවතින නිසා දු, ථ අකුරු හා ඉන්පසුව උදාවන රේවතී නැකතට හිමිවන දෙ, දො, ච, චි අකුරුත් දිනයට සුදුසු වන ට, ඩ, ණ අක්ෂරත් සුබදායකයි.

23 ගුරුද

මෙදින දහවල් 02.14 දක්වා රේවතී නැකත උදාව පවතින නිසා දෙ, දො, ච, චි අකුරු හා ඉන්පසුව උදාවන අස්විද නැකතට හිමිවන චු, චෙ, චො, ල අකුරුත් දිනයට සුදුසු වන ත, ද, ධ, න අක්ෂරත් ගළපා නම් තබන්න.

ග්‍රහ දෘෂ්ටි

17 කිවිදා
උදේ 10.20 බු, කු, චතු
දවල් 01.59 ච, බු, ෂඩ්
දවල් 02.09 ර, ච, ෂඩ්
සවස 04.16 ර, බු, සං
රාත්‍රී 09.22 ච, ශු, චතු

18 ශනිදා
අලුයම 03.56 ශු, ශ, ෂඩ්
රාත්‍රී 09.58 ච, ගු, ෂඩ්
සවස 04.04 ච, කු, ත්‍රි
රාත්‍රී 10.59 ච, ශ, සං

20 සඳුදා
අලුයම 02.25 ච, ශු, ෂඩ්

21 කුජදා
සවස 06.26 ච, කු, චතු
රාත්‍රී 10.54 ර, ච, සං

22 බුධදා
උදේ 07.05 ච, බු, සං
23 ගුරුදා
අලුයම 01.48 ච, ගු, සං
රාත්‍රී 10.44 ච, කු, ෂඩ්

සුබ දවස්

18 දා දවල් 11.14න් පසු සුබයි.
19 දා උදේ 08.09 සිට රාත්‍රී 10.05 දක්වා සුබයි.
20 දා අලුයම 04.57 දක්වා සුබයි.
23 දා මුළු දවසම සුබයි.

රාහු කාලය

17 ශු උදේ 10.48 - 12.20, රාත්‍රී 10.49 - 12.19
18 ශ උදේ 09.17 - 10.48 රාත්‍රී 09.20 - 10.50
19 ර සවස 04.50 - 06.21 අලුයම 04.45 - 06.15
20 ච උදේ 07.45 - 09.17 රාත්‍රී 07.50 - 09.20
21 කු සවස 03.19 - 04.50 අලුයම 03.15 - 04.45
22 බු දවල් 12.17 - 01.48 රාත්‍රී 12.17 - 01.47
23 ගු දවල් 01.48 - 03.19 අලුයම 01.46 - 03.15

සුබසෙත

මේ සතියේ ඔබට

මාර්තු 17 සිට මාර්තු 23 දක්වා

ධම්මිකා
රාජපක්ෂ



මේෂ

වාත අමාරුවක්

නොසන්සුන්කාරී ගති පැවැතුම් තමාට අවාසිදායක තත්ත්වයක් ඇති කරන සතියක් වන අතර, මේ සතියේ සඳු ග්‍රහයාගේ ගමන සිදුවන්නේ 9, 10, 11, 12 යන භාවයන් මතිනි. වෙනදාට වඩා යොදාගත් කටයුතු කීපයක් ප්‍රමාදවීමට ඉඩ ඇත. නොසිතූ ලෙස ඇති කරන සහෝදර සිත් අමනාපයක් දුරදිග යාමට ඉඩ ඇති බවක් පෙන්නුම් කරයි. අමතර ලැබීම් ඇති කරන කාලයකි. එහෙත් පවුලේ කෙනකු වෙනුවෙන් හදිසි මුදලක් වැය කිරීමට සිදු කරයි. දරුවකු සම්බන්ධ සතුටුදායක පුවතක් අසන්න ලැබෙන කාලයකි. හදිසි වාත අමාරුවකට ප්‍රතිකාර ලබා ගැනීමට සිදු කරයි.

අය 07 - වැය 03
ජය වර්ණය - තැඹිලි
ජය අංකය - 09
සුබ දවස - බ්‍රහස්පතින්ද



සිංහ

අතක වේදනාවක්

මෙතෙක් පැවැති වගකීම් කීපයකින් නිදහස සැලසෙන සතියකි. දරුවකුගේ ඉදිරි සැලසුමක් පිළිබඳ වෙනස්කම් කීපයක් සිදු කරයි. නිතර ඇවිදිලි ඇති කරන කාලයකි. යටපත් වූ අතක වේදනාවක් නැවත මතු කරයි. සහෝදරයකු වෙනුවෙන් උපකාරයක් කිරීමට කටයුතු සැලසෙන අතර, මෙතෙක් අතර මඟ නවතා තිබූ කටයුතු කීපයක් නැවත ආරම්භ කිරීමට අවස්ථාව උදා කරයි.

දරු ලාභ අපේක්ෂාවෙන් සිටින අයට සුබදායක කාලයකි. නිතර පින්දහම් කටයුතුවල නිරත වන්න. සති අන්තයේදී විදෙස්ගත ඥාතියකුගේ පැමිණීමක් සිදු කරයි.

අය 06 - වැය 03
ජය වර්ණය - දම්
ජය අංකය - 02
සුබ දවස - සිකුරාද

ධනු

හදිසි ගනුදෙනුවක්

හිතුමතයට කටයුතු කිරීමෙන් නොසිතූ ලෙස පාඩු කීපයක් සිදු කරන සතියක් වන අතර, මේ සතියේ සඳු ග්‍රහයාගේ ගමන සිදුවන්නේ 1, 2, 3, 4 යන භාවස්ථානවලයි. හදිසි ගනුදෙනුවකට අත ගැසීමට කටයුතු යෙදෙන කාලයකි. දරුවකුගේ වගකීම් කීපයක් තමා වෙත පැවරෙන බවක් පෙන්නුම් කරයි. වෙනදාට වඩා යන එන ගමන් පිළිබඳ සැලකිලිමත් වන්න. ගේ දොර කටයුතු පිළිබඳ වෙහෙසීම් ඇති කරන කාලයකි. සතිය මැද කාලයේ දී දරුවකුගේ විශේෂ ජයග්‍රහණයක් වෙනුවෙන් සතුටට පත්වීමට හේතු යෙදේ. සුරතල් සතෙකු නිසා තමා නොසිතූ ලෙස ගැටලුවකට මුහුණපායි.

අය 07 - වැය 04
ජය වර්ණය - කහ
ජය අංකය - 04
සුබ දවස - බදාද

වෘෂභ

හදිසි විදෙස් ගතවීමක්

මෙතෙක් ඇතිව තිබූ ගැටලුකාරී බවක් මඟහැරී යන කාලයක් වන අතර, මේ සතියේ සඳු ග්‍රහයාගේ ගමන සිදුවන්නේ 8, 9, 10, 11 යන භාවයන් මතිනි. රැකියාවේ ගැටලුවක් දුරදිග යන කාලයකි. නිතර තමා සොයාගෙන එන කෙනකු නිසා කරදරකාරී බවක් ඇති කරයි.

සතිය මැද කාලයේදී හදිසි විදෙස් ගතවීමක් පිළිබඳ බලාපොරොත්තුවක් ඉටුවන බවක් පෙනේ. නිතර පින්දහම් කටයුතුවලට සම්බන්ධ වන කාලයකි. දේපළ ගැටලුවක් දුරදිගයාමෙන් සහෝදර මත භේදයක් ඇති කරයි. සති අන්තයේදී මවුපස ඥාතියකු වෙනුවෙන් කැපවී කටයුතු කිරීමට සිදුවේ.

අය 06 - වැය 04
ජය වර්ණය - දම්
ජය අංකය - 03
සුබ දවස - බ්‍රහස්පතින්ද

කන්‍යා

දේපළ මිලදී ගැනීමක්

පවුලේ ඉදිරි සැලසුමක් වෙනස් කිරීමට සිදුවන සතියක් වන අතර, මේ සතියේ සඳු ග්‍රහයා ගමන් කරන්නේ 4, 5, 6, 7 යන භාවයන් මතිනි. ගේ දොර කටයුතු සම්බන්ධ අවිවේකී බවක් ඇති කරන කාලයක් වන අතර, නිතර ඒ සම්බන්ධ කටයුතුවලදී ගැටලු කීපයක්ද මතු කරයි. පැවැති පාදයේ ආබාධයක් සුව අතට හැරෙන ලකුණු පෙන්නුම් කරයි.

අලුත් දේපළ මිලදී ගැනීමකට හෝ දේපළ හුවමාරුවක් සම්බන්ධ කටයුත්තකට අත ගසයි. පියපස ඥාතියකු පිළිබඳ සතුටට පත්විය හැකි අන්දමේ පුවතක් අසන්න ලැබේ. විවාහ යෝජනාවකට බාධාගෙන දෙන අන්දමේ කටයුතු කීපයක් යෙදෙන කාලයකි.

අය 07 - වැය 03
ජය වර්ණය - කහ
ජය අංකය - 04
සුබ දවස - සඳුද

මකර

තැන්පත් ධනය වැයවීමක්

ගෘහ ජීවිතයේ කටයුතු පිළිබඳ මානසික අසහනකාරී බවක් ඇති කරමින් සතිය ආරම්භ වන මකර ලග්න හිමි ඔබගේ සඳු ග්‍රහයා මේ සතියේ ගමන් කරන්නේ 12, 1, 2, 3 යන භාවස්ථානවලයි. මෙතෙක් කරගෙන ආ වැඩපිළිවෙළක් වෙනසකට ලක් කරන සතියකි. නොසිතූ ලෙස තැන්පත් ධනය වැයවන අන්දමේ කටයුතු කීපයක් යෙදේ. නිතර මව හෝ මවුපස ඥාතියකු වෙනුවෙන් වෙහෙසීම් ඇති කරයි. ගේ දොර අලංකාරය වෙනුවෙන් අලුත් බඩුබාහිරාදිය මිලදී ගැනීමක් ද සිදු කරයි. පාදයේ ආබාධයකට හෝ හදිසි වැටීම් තැලීම් වැනි අනතුරුදායක තත්ත්වයකට මුහුණපෑමට ඉඩ ඇති බැවින් කල්පනාවෙන් කටයුතු කරන්න.

අය 07 - වැය 07
ජය වර්ණය - තැඹිලි
ජය අංකය - 06
සුබ දවස - සිකුරාද



මිථුන

සෙම් රෝග බහුල කරයි

නීති ගැටලුවට මැදිවන සතියක් වන අතර, මේ සතියේ ඔබේ ලග්නයට අනුව සඳු ග්‍රහයා ගමන් කරන්නේ 7, 8, 9, 10 යන භාවයන් මතිනි. එදිනෙදා කටයුතු සම්බන්ධව ඇති කරන අවිවේකී බව හේතුවෙන් යොදාගත් සැලසුමක් වෙනස් කිරීමට සිදුවෙයි. එමෙන්ම වෙනදාට වඩා ආගමික භක්තියෙන් කටයුතු කරන කාලයක් බව පෙන්නුම් කරයි. සෙම් රෝග බහුල කාලයක් බැවින් එදිනෙදා කටයුතුවලදී මෙන්ම කෑමෙන් බීමෙන් ද පරිස්සම් වන්න. උත්සාහයේ තරමට ප්‍රතිඵල නොලැබෙන කාලයකි. සති අන්තයේදී පවුලේ වැඩිමහල් දරුවකු පිළිබඳ සතුටුදායක පුවතක් අසන්න ලැබේ.

අය 07 - වැය 06
ජය වර්ණය - දම්
ජය අංකය - 09
සුබ දවස - සිකුරාද

තුලා

ආගමික සහන

වෙනදාට වඩා ලැබීම් අතින් යහපත් වුවත් වැය පස අධික වන බවක් ද පෙන්නුම් කරයි. මේ සතියේ සඳු ග්‍රහයා ගමන් කරන්නේ 3, 4, 5, 6 යන භාවයන් මතිනි. පවුලේ කෙනකු වෙනුවෙන් කැපවී කටයුතු කිරීමට සිදුවන සතියකි. වෙනදාට වඩා ඇවිදිලි ඇතිවන අන්දමේ කටයුතු කීපයක් යෙදෙන අතර, පවුලේ ගැටලු කීපයක් නිරවුල් කර ගැනීමටද මඟ සැලසේ. ආගමික සැලසුමක් වෙනුවෙන් වෙහෙසීම් වැඩි කරන අතර, නිතර ආගමික සහන පතා දුර පළාතකට ද යාමට සැලසුම් ඇති කර ගනී. සති අන්තයේදී වරින් වර ඇති කරන යටිබඩ ආශ්‍රිත ආබාධයකට ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවේ.

අය 07 - වැය 05
ජය වර්ණය - දම්
ජය අංකය - 09
සුබ දවස - බ්‍රහස්පතින්ද

කුම්භ

රාත්‍රී ගමන් බහුලයි

අවිවේකී ලෙස උදා කරන මේ සතියේ සඳු ග්‍රහයා ගමන් කරන්නේ 11, 12, 1, 2 යන භාවයන් මතිනි. මනසට අවිවේකී ලෙස කටයුතු කීපයක් යෙදෙන සතියකි. පවුලේ කටයුතු සම්බන්ධ විශේෂ වෙහෙසීම් ඇති කරයි. අලුත් නෑදෑ හිතවතුන් දැන හඳුනා ගැනීමට අවස්ථාව සැලසෙන කාලයකි. නිතර රාත්‍රී ගමන් බහුල වන බවක් පෙන්නුම් කරයි.

පවුලේ ඉදිරි සැලසුමක් වෙනස් කිරීමට සිදුවන බවක් පෙන්නුම් කරයි. මුදල් ගනුදෙනුවක් හේතුවෙන් නීතිමය පිහිට පැතීමට සිදුවේ. සහකරු හෝ සහකාරිය සමඟ ඇතිවන මතභේදයක් දුරදිග යන ලකුණු පෙන්නුම් කරයි.

අය 06 - වැය 05
ජය වර්ණය - නිල්
ජය අංකය - 02
සුබ දවස - බ්‍රහස්පතින්ද

කටක

දුර ගමනක්

නිතර තමා සොයාගෙන එන කෙනකු නිසා කරදරකාරී බවක් ඇති කරන සතියක් වන අතර, මේ සතියේ සඳු ග්‍රහයා ගමන් කරන්නේ 6, 7, 8, 9 යන භාවයන් මතිනි. පවුලේ කටයුතු පිළිබඳ වෙනදාට වඩා වෙහෙසීම් වැඩි කරයි. නිතර නිවෙසින් පිට වාසයට කරුණු සැලසෙන කාලයකි. එමෙන්ම ගේ දොර අලංකාරය වෙනුවෙන්ද වෙහෙසෙන බවක් පෙන්නුම් කරයි. දුර ගමනක් වෙනුවෙන් කාලයත් ශ්‍රමයත් වැය කිරීමට සිදුවන බවක් පෙන්නුම් කරයි. පාදයේ වළලුකර ආශ්‍රිතව ඇතිවන අසනීප තත්ත්වයකට ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවේ. යන එන ගමන් පිළිබඳ සැලකිලිමත් වන්න. පවුලට අලුත් සාමාජිකයෙක් එක්වන ලකුණු පෙන්නුම් කරයි.

අය 07 - වැය 04
ජය වර්ණය - නිල්
ජය අංකය - 04
සුබ දවස - බදාද

වෘශ්චික

දරුවකුගේ අසනීපයක්

පවුලේ කටයුතු සම්බන්ධ විශේෂ උනන්දුවක් ඇති කරන සතියක් වන අතර, මේ සතියේ සඳු ග්‍රහයාගේ ගමන සිදුවන්නේ 2, 3, 4, 5 යන භාවයන් මතයි. නොසිතූ ලෙස පවුලේ දේපළ ගැටලුවකට මුහුණපෑමට සිදුවෙයි.

එමෙන්ම ගෘහ ජීවිතයේ කටයුතු පිළිබඳ අවිවේකී බවක් ඇති කරයි. අලුත් රැකියා හිමිකම් ඇති කාලයක් වුවත් ඒ පිළිබඳ නොසිතූ ගැටලුවකට මුහුණපෑමට සිදුවෙයි. නිතර නිවෙසට යන එන කෙනකු පිළිබඳ සිත්තැවුලක් අසන්න ලැබේ.

දරුවකුගේ හදිසි අසනීපයකට ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවන සතියකි.

අය 06 - වැය 05
ජය වර්ණය - කොළ
ජය අංකය - 02
සුබ දවස - බ්‍රහස්පතින්ද

මීන

හිසේ ආබාධයක්

මෙතෙක් ප්‍රමාදතා සිදුකළ කටයුතු කීපයක් සාර්ථක ලෙස නිමාවට පත්කර ගැනීමට හැකිවන සතියකි. මේ සතියේ සඳු ග්‍රහයා ගමන් කරන්නේ 10, 11, 12, 1 යන භාවස්ථානවලයි. අමතර වියදම් බහුල කරන සතියකි. වෙනදාට වඩා ගතට සිතට පීඩාකාරී බවක් ඇති කරයි.

රැකියාවේ කටයුතු සම්බන්ධ සුබදායක පුවතක් අසන්න ලැබේ. පවුලේ කෙනකුගේ හදිසි අසනීප තත්ත්වයක් හේතුවෙන් රෝහල් ගතවීමක් සිදු කරයි. සති අන්තයේදී වරින් වර ඇති කරන හිසේ ආබාධයකට ප්‍රතිකාර ලබා ගැනීම සිදුවන බවක් පෙන්නුම් කරයි.

අය 06 - වැය 05
ජය වර්ණය - දම්
ජය අංකය - 05
සුබ දවස - බ්‍රහස්පතින්ද

ජනකවියාගේ ශ්‍රී පාද වන්දනය

සම්බුදු පියාණන් වහන්සේගේ ශ්‍රී පාද ලාංඡන සතරක් නර්මදා නදී තීරය සච්චබද්ධ ගිර, සමනොළ ගිර, යෝනක පුර යන ස්ථානයන්හි වන බැව් "යන්නම්මදාය නදියා පුලිනේච තීරේ" යනාදී ලෙසින් දක්නා වන්දනා ගාථාවෙහි කියැවේ.

මින් සියලු ලෝවැසි සැදැහැතියන්ගේ වන්දනාමාන ගෞරව භක්ත්‍යාදරයට පාත්‍රව දක්නට ලැබෙන්නේ සිරිලක සමනොළ ගිර සිරිපා ලාංඡනය යි. බුදුපියාණන් වහන්සේගේ තෙවන වර ශ්‍රී ලංකාද්වීපයට වැඩි ගමනේ දී සුමන දෙව්රද ඇරැයුමෙන් සමනොළ ගිර මත ශ්‍රී පාද ලාංඡනය පිහිටු වූ බැව් සඳහන් ය.

සමනොළ ගිර

සමනොළ ගිර වන, මෘග, පක්ෂි ආදීනට නෘත්‍ය මණ්ඩපයක්, ගායනා කරන්නන්ට ගී මඩුවක්, සා පිපාසා සංසිඳුවන ආපාන භූමියක් වැනි යයි යනාදී ලෙසින් එහි නයනාභිරමණීයත්වය දර්ශනීයත්වය සමන්තකූට වර්ණනා ආදී ග්‍රන්ථයන්හි මෙන් ම ජන කවියෝ ද, විදේශිකයෝ ද දකිති. සමනල කන්ද එදත් අදත් කවීනට බෙහෙවින් වස්තු විෂය විය.

ලංකාවට අධිපති පර්වත   මුදු නේ
සිංහසානේ වද මුනිඳුට පහළ   වුනේ
පිහිටි සිරිපාද පර්වත කොත   මුදු නේ
ගංගා සතර පර්වතයෙනි උපත   වු නේ

යයි ජනකවියා සමනොළ ගිර පිළිබඳ මහත් ගෞරවයෙන් අභිරුචියෙන් කියා පායි. ආගමික කරුණු නිසා ම පමණක් නොව රට සරු කරමින් සතර දෙසට ගලන සිවු ගංගාවන්ගේ ප්‍රභවය නිසා ද ජනතාවගේ ප්‍රණාමය හිමි කර ගනියි. ස්වභාව සෞන්දර්යය රිසියෝ ද සමනොළ ගිර මහත් අගයති. රාත්‍රියෙහි ගැල් පදවන ගැල්කරුවාට සමනොළ කන්ද පෙනේ. එය ඔහු දකින්නේ මහත් වූ ශ්‍රද්ධා භක්තියෙනි. ඔහුගේ මුවින් පිටවන්නේ ඒ දැක්මෙන් මහත් සැනසුමක් ලැබීමත් බැව් හැඟියේ.

අලට කන්න බැරි අලගල්ලේ   ක න්ද
බතට කන්න බැරි බතලේ ගල   ක න්ද
හුනට කන්න බැරි හුන්නස්ගිරි   ක න්ද
මෙකඳු තුනට නායක සමනල   ක න්ද

ජනකවියා පවසන්නේ සියලුම බුදුවරුන් සමනල ගිර සිරිපා සටහන් තැබූ බව ය.

"ඔක්කොම මුණි බුදුව ලොවට සමනල ගල පිටට වැඩි ය
දැක්කම සිරිපාද එබූ අණසක මිහි දෙරණ තලය"

සමන් දෙවි

ශාසන භාර සමන් දෙවිඳු සමනල පර්වතයට අධිගෘහිතය. ලක් වැසියන්ගේ මහත් වූ ගෞරවාදරයට පාත්‍ර වූවෙකි.

සමන්තකූට පර්වතයක - සාසන භාරව සිටිනෙක
සවන් පුරා අසන බණක - රකින සීලෙ සිල්මති මෙක
අතින් දරන පත් කඩයක - නාගුණ වැල් නිතර අතක
සමන් දෙවිඳු යන උතුමෙක - දෙවොල් යකුට බලපෑවෙක

සමන්තකූට පර්වතයත්, ශාසනයත්, භාරව ආරක්ෂා කරන පත්කඩය, නවගුණවැල ගෙන සිල් රකින සමන් දෙවිඳුගේ වාහනය සුදු ඇතෙකි.

සුද්ද ලෙසින් නිති ගත   බබළ න්නේ
සුද්ද ඇතා පිට වද වැඩ   ඉ න්නේ
බුද්ධ මෙසාසන දිවුණු   කර න්නේ
සුද්ද සමන් දෙවියෝය   වඩි න්නේ

සමන් දෙවිඳු සමනල කන්දේ අධිගෘහිත දෙවි නිසා පෙර සිට ම සමනල කන්ද වැඳුම් පිදුම් ලැබූ බව පෙනේ.

මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීහු ආර්ය ජනතාව ඉතා ඈත කාලයේ සිට ඇදහූ දෙවිවරුන් අතර ඉතා සැලකිය යුත්තෙක් වන යමරජු සමන් දෙවියන් බව පවසයි. යම රජුට සකු බසේ ගමන් යයි හැඳින්වෙයි. සිංහල බසට එය "සමන්" ලෙස පෙරළී ඇත. කරුණා රසයට යමරජු අධිපති බව නාට්‍ය ශාස්ත්‍රයේ වෙයි. ශ්‍රී පාද වඳින්නෝ අදත් 'කරුණාවයි' කියා හඬ නඟමින් යන්නේ ඒ නිසයි. මේ ආදී ලෙස පරණවිතාන සූරීහු සමන් දෙවි ගැන කියති.

සමන් දෙවිඳුන් පිළිබඳ සුප්‍රසිද්ධ සබරගමු මහ සමන් දේවාලය ද ජනකවියා අමතක නොකරයි.

හෙළ මුඳුනින් වැඩිය කලට පෙනේය උළු   මාළිගා ව
රෑ දහවල් එළිය ඇතුව රන් කොත් බබළන   සුබා ව
බිම්බරකට සෙනඟ ඇවිත් සෑ දෙවි උළු   මාළිගා ව
මුළු රටටම පාරට්ටුයි සබරගමුවෙ   මාළිගා ව

අපූර්ව හාස්කම් දක්නා මෙහි ඇති ලියලන ගල ගැන ද සඳහන් කරයි. සබරගමු මහ සමන් දෙවොලේ අද ද ඒ දක්නට ඇත.

කුරුවිට කෝරලේ පල්ලේ පත්තුවේ උතුම් සබරගමු   දේවාලේ
දවසින් දවසට ලියලාගෙන එන ගලක් තිබුණු කීවා මැද   මාලේ
ලොව සත හට මතුවට පවතින්නට සුමන දෙවිඳු පෑවාද   බලේ
එම ගල සතියනි තව ලියලනවද උතුම් සබරගමු දේවා   ලේ

සමන් දෙවිඳු පිහිටෙන් සිරිපා කරුණා කරමින් සමන් දෙවිඳුන්ට පින් දීම මෙන් ම සියලු විපත් කරදරවලදී සමන් දෙවිඳු පිහිට පැතීම ලක්ෂණයක් විය. විවිධ බාර හාර වෙති. ඒ ඉටුවන බව ද දැඩි විශ්වාසය යි.

සීත ගඟුල

සිරිපා වැඳුම ජීවිතයේ වැදගත් ම අවස්ථාවක් බවත් මෛත්‍රිය බුදුන් දැක්මට ඒ හේතුවන බවත් කියයි. සමන් දෙවිඳු කරුණාවයි. සුමන සමන් දෙවි පිහිටයි. ආදී වශයෙන් කියමින් ගමනාරම්භ කරන සිරිපා මුලදී ළංවන්නේ සීත ගඟුලට ය.

සීත ගඟුලෙ පන්සිල්   අර ගෙ න
උණුසුම් ඇති පිළි පමණක්   ඇඳ ගෙ න
සමන් දෙවිඳු හට පඬුරුත්   බැඳ ගෙ න
සාදු කියා යමු සතුටින්   හැම දෙ න

සීත ගඟුලේදී දිය නා සුදු පිරුවට ඇඳ පඬුරු බැඳ ගමන් අරඹයි.

ගෙත්තම් පාන

නඩේ අනතුරුව ගෙත්තම් පානට පිවිසෙති. බුදුරදුන් තම සිවුර මැසූ ස්ථානය යයි ජනප්‍රවාදයේ එන කතාව අනුව ගෙත්තම්පාන නමින් හැඳින්වෙන තැන්හි ඉදිකටු, නූල් පූජා කිරීම සිරිත.

ගෙත්තම් පාන ඉදිකටු පූජා   කර මු
හැරමිටි පාන හැරමිටි පූජා   කර මු
දොඩම් බැවිල තල අබ පූජා   කර මු
සිරි පතුලට රත් මල් පූජා   කර මු

ධර්මරාජ ගල

සීතල දැනුන ද සාදු නාදයේ අඩුවක් නොපෙනේ. හිමේ නඟින සැදැහැතියන්ට ධර්මරාජ ගලද පෙනේ. පඩි ගණන් කළ ද කියදැයි කිව නොහැකි වීම අපූර්වත්වයක් ලෙස නඟී.

ධර්මරාජ ගල යටින්   පෙනෙ න්නේ
බොහොම දෙනෙක් පඩි ගණන්   කර න්නේ
ගණන කියන්නට බැරිලු   බොල න්නේ
කිමද කියා සමහරු   ළතවෙ න්නේ

හැරමිටි පාන

අනතුරුව මොවුහු හැරමිටි පානට පිවිසෙති. මේ සියලු තැන්හි පඬුරු බැඳීමට ද, සමන් දෙවිඳුන්ට පින් දීමට ද, ඔවුහු අමතක නොකරති.

සමන් දෙවිඳුගෙන් පිහිට   ලබ නවා
උතුම් බුදුන් අපි වඳින්න   ය නවා
හැරමිටි පානේ අපි   නවති නවා
එතනදී සමහරු පඬුරු   බඳි නවා

ඇහැළ කණුව

ඉන්පසුව කුඩා ගිරිදඹය පසු කරයි. ඇහැළ කණුව ළඟ නැවතී ගිමන් විඩා හැර ගනිති.

ඇහැළ කණුව ළඟ ගොස්   නවති න්නේ
අට සිල් පන්සිල් අරගෙන   ය න්නේ
සිතේ කුහක කම් අත්හැර   ග න්නේ
සමන් දෙවිඳුනේ පිහිටක්   ව න්නේ

මහ ගිරි දඹය

මහ ගිරි දඹය ගමන දුෂ්කර ස්ථානයකි. එහෙත් එයට පහසුවක් ලෙස සලකමින් සමන් දෙවි කරුණාවෙන් කරුණා කරති.

වට පිට නොබලා පාර   බලන් නේ
අඩියෙන් අඩියට සාදු   කියන් නේ
දම්වැලෙ එල්ලී දඹය   නඟින් නේ
සමන් දෙවිඳුනේ අප රැක   දෙන් නේ

ශ්‍රී පාද පද්මය

දම්වැලේ එල්ලී ගමන්ගත් පිරිසක් වේගවත් සුළඟකින් දම්වැල එහා මෙහා පැද්දී තෙරක් නොපෙනෙන ආගාධයට වැටීමේ ශෝචනීය පුවතක් ජෝන් ස්ටීල් සඳහන් කරයි. බොහෝ දුර බැහැරක සිට නොයෙකුත් දුෂ්කරතා මැද සමනොළ කන්ද නඟිනා වන්දනාකරුවෝ කවර දුක් ගැහැටක් ආවද එය සුළුකොට තකති. කවුරුත් සමඟ සහයෝගයෙන් එකම පවුලේ සහෝදරයන් ලෙස මහත් වූ කරුණාවෙන් සමන් දෙවිඳුන්ට පින් දිදී ශ්‍රී පාද මුඳුනට ළංව ශ්‍රී පාද පද්මය දකිති. ගමනේ සියලු දුෂ්කරතා එහි දී ඔවුනට අමතක වෙයි. මහා ජයක් ලද සේ සිතයි. සිරිපා පද්මය රිසි සේ සිත් සේ වැඳ පුදා ගනියි.

සියලු දෙනම ගොස් පද්මෙ   වඳි න්නේ
මාර යුදෙන් ජය ගත්තා   වැ න්නේ
පුද පූජා කොට පින් ලැබ   ගන් නේ
සුමන සමන් දෙවි මේ පින්   ග න්නේ

වෙනද මහ මඟ යන්නන්ට තරම් වාරු නැති මහල්ලෝ ද යෞවනයන් මෙන් මහත් උනන්දුවෙන් රන්ගිරිදඹේ ආදිය නඟින හැටි පුදුම ය. ඔවුන්ගේ මානසික ශක්තිය කායික ශක්තිය, කරුණා ශ්‍රද්ධා එක්වීමෙන් ප්‍රබල වෙමින් මහත් ආත්ම ශක්තියක් ලබන්නට ඇත. ඈත කල සිරිපා වන්දනාවේ යෙදුණෝ සිය අන්තිම කැමැත්ත පවා ලියා තබා ආවේ ගමනේ දී දක්නා දුෂ්කරතාව මත ආපසු යෑම අවිනිශ්චිත සේ සැලකීමෙනි.

කොතරම් දුෂ්කර වුව ද මුවින් පිටවනුයේ කරුණාවයි. කරුණාවයි යන්නය. ඔවුන්ගේ කවි ගමන් විඩාව දුරු කරවයි. ශ්‍රී පාද වැඳුම පිළිබඳ භක්තිය ප්‍රකට කරවයි. ඒ ආකාර ජනකාව්‍ය රාශියක් සිංහල ජනතාව ඇසුරේ වෙයි. සමන්තකූට පර්වතය මුඳුන කෙතරම් ජනකායක් ඒකරාශී වූවත් ඉඩ ඇහිරීමකින් වන්දනාකරුවනට බාධා නොමැති වීම ආශ්චර්යයකි. සෑම වසරකම උඳුවප් පුර පසළොස්වක පොහෝ දා සිට වෙසක් පුර පසළොස්වක පොහොය දක්වා කාලය සිරිපාද වන්දනා සමය වෙයි. ඉතා පුරාණයේ සිටම සිරිපා වැඳුමට සමනල කඳු නැගීම දක්නට වෙයි. මේ වන්දනා ගමන යන්නේ නඩ වශයෙනි. නඩේ ගුරෙක් සිටී. යෑමට පෙර ගමේ පන්සලට ගොස් බාර හාර වෙති. විවිධ චාරිත්‍ර වෙති. කටබහ ප්‍රවේශම් කරගනිති. මේ සියල්ල පිළිබඳ ජනකවි මුවෙන් පිට වූ බව සිරිපා වන්දනා ජනතාව දෙස බලන විට පෙනේ. තුන් සරණය, හිමගත වර්ණනාව, සමන් දෙවි වරුණ වැනි පොත්වලින් පද්‍ය ගායනා කරමින් සිරිපා වඳිති. ඒවා ගායනා කරන්නේ නඬයේ හොඳින් ගායනා කළ හැකි උවසුවකුගේ හෝ උවැසියකගේ ගායනය අනුකරණය කිරීමෙනි. ඉහළ නඟින කණ්ඩායම් හා පහළ බසින කණ්ඩායම් ඒ හමුවන අවස්ථාවන්හි පහළ බසින අය "වඳින්න යන මෙ නඩේට සුමන සමන් දෙවි පිහිටයි" කියන කළ ඉහළ නඟින්නෝ වැඳල බහින මේ නඩේට සුමන සමන් දෙවි පිහිටයි යනුවෙන් කියති.

ආචාර්ය
සිරිපාල මාදුවගේ

ශරීරයට අවශ්‍ය යකඩ, තඹ, සිලිකා, මැග්නීසියම්, පොටෑසියම්, සෝඩියම් හා විටමින් අන්තර්ගත ලොව පැරණිම ඖෂධයකි.

ආයුර්වේදයට නැතිවම බැරි මී පැණි

මීපැණිවල ඛනිජ කොටස් එකොළහක් ද මධුර පදාර්ථ අසූ එකක්ද ඇතුළත් බව පර්යේෂණවලින් හෙළි වී ඇත. එහි මීපැණිවල සියයට හැත්තෑ තුනක්ම (73%) ඇත්තේ ශක්තිය ලබාදීමට අවශ්‍ය සීනි වර්ගයකි. එහි සියයට හැත්තෑපහ සිට අසූව දක්වා (75% - 80%) දක්වා ඩෙක්ස්ක්රෝස් සහ ලිව්රෝස් යන සීනි වර්ග ද අඩංගු වේ.

විටමින් බී, තයමින්, විටමින් ඩී, ඇස්කොබික් අම්ලය, රයිබොප්ලේවින් පැන්තෝතෙන්ටික් අම්ලය, පයිරි ඩොක්සින්, නියැසින් ඇතුළු තවත් විටමින් රාශියක්ම අන්තර්ගතව ඇත. මී පැණිවල ලවණ අඩංගුව ඇත්තේ ඉතාම සුළු ප්‍රමාණයකි. එමෙන්ම මිනිස් පැවැත්මට අත්‍යවශ්‍ය වන කැල්සියම්, පොස්පරස්, මැග්නීසියම් වගේම අයඩින්ද අන්තර්ගතව ඇත. වර්ගීකරණය අනුව මී පැණි වර්ග අටක් ඇති බව ආයුර්වේදයේ දැක්වේ.

ධාරණ ශක්තිය වර්ධනය කර ගැනීමට මී පැණි මහඟු ඖෂධයකි. මහන්සිය මඟහරවා ශක්තිය ලබාදීමටත් මී පැණිවලට ඇත්තේ පුදුම ගුණයකි. සංස්කෘත භාෂාවෙන් මධු යන නාමයෙන්ද හඳුන්වන මී පැණි වර්ග අටකින් සමන්විත වන බවට හඳුනාගෙන ඇත. මාකෂික, භාමර ආශාරය්‍යයේ, පයිත්තික, අවුද්ධාලක, ජද්ර, දාලා, ක්වුද යනුවෙනි.

මී පැණි පහසුවෙන් දිරවන අතර ශරීරගතව ඉක්මනින් ගුණ ලබාදෙයි. සෙම නොවඩා ශරීරයේ සෙම නසාලයි. මීපැණි ඇස්වලට හිතකර බැවින් විවිධ ඇස් රෝග සඳහා අභ්‍යන්තරව මෙන්ම බාහිරව ද යොදනු ලැබේ. කුසගින්න ඇතිකරන මී පැණි කටහඬ ද මිහිරි කරවයි. අඩු වයසින් ඇස්පෙනීම දුර්වල වන දරුවන්ට මෙන්ම පෙනීම දුර්වල වැඩිහිටියන්ටත් ඇස්පෙනීම වර්ධනය කර ගැනීමටත් කැරට් ඉස්මට මී පැණි මිශ්‍රකර බීම ගුණදායකය.

මී පැණි ග්‍රෑම් සියයක අඩංගු පෝෂණීය පදාර්ථ ශක්තිය කිලෝකැලරි 1.272, කාබෝහයිඩ්‍රේට් ග්‍රෑම් 82.4, සීනි ග්‍රෑම් 82.12, කෙළි ග්‍රෑම් 0.2, ප්‍රෝටීන ග්‍රෑම් 3, ජලය ග්‍රෑම් 17.1, බී. 2 කාණ්ඩය විටමින මිලිග්‍රෑම් 0.38, බී 3කාණ්ඩය මිලිග්‍රෑම් 12.1, බී. 3 කාණ්ඩය විටමින මිලිග්‍රෑම් 12.1, බී. 5 කාණ්ඩය මිලිග්‍රෑම් 24, බී 12 කාණ්ඩය විටමින මිලිග්‍රෑම් 2, විටමින් සී මිලිග්‍රෑම් 5, කැල්සියම් මිලි ග්‍රෑම් 6, යකඩ මිලිග්‍රෑම් 42, මැග්නීසියම් මිලිග්‍රෑම් 2, පොස්පරස් මිලිග්‍රෑම් 4, පොටෑසියම් මිලිග්‍රෑම් 52, සෝඩියම් මිලි ග්‍රෑම් 4, සින්ක් මිලිග්‍රෑම් 22 කුෂ්ට රෝග වැනි සමේ හටගන්නා රෝග රැසකට ගුණදායකය. මී පැණි පිත් රෝග ලේ සම්බන්ධ රෝගවලට හා ප්‍රමේහ පණුරෝගවලටත්, ළදරු රෝගවලටත් දෙනු ලබන මහඟු ඖෂධයකි. මී පැණි පහසුවෙන් දිරවන ඖෂධයක් වන අතර, සෙම වර්ධනය නොකොට සෙම අඩුකරයි. මලපහ කිරීමේදී ඇතිවන අපහසුතා සහ මල බුරුල්ව යන අවස්ථාවලදී මී පැණි ටිකක් බීමෙන් එය මඟ හරවා ගත හැකිය.

මී පැණිවල ඇති විශේෂත්වය වන්නේ මීපැණි පරණ වූ තරමට ඒවා ගුණාත්මකභාවය වැඩිවීමයි. කැස්සට මී පැණි හොඳ බෙහෙතකි. ප්‍රතිශ්‍යා කැස්සට ඉඟුරු ඉස්ම, දොඩම් ඉස්ම හා මීපැණි මිශ්‍රකර වරින්වර තේ හැන්දක් හෝ දෙකක් හෝ බීමෙන් සහනයක් ලබා ගත හැකිය. අජීර්ණයට, බඩේ දැවිල්ලට මෙන්ම ඕක්කාරයටත්, වමනය යැවීමටත්, මීපැණි ස්වල්පයක් බොන්නට දීමෙන් ගුණයක් ඇතිවේ. කිසියම් මානසික හෝ කායික හේතුවක් නිසා නින්ද නොගොස් අවදිව සිටින්නේ නම් ඔහුට හෝ ඇයට රාත්‍රි නින්දට පෙර මී පැණි හැන්දක් බීමට දීමෙන් සැප නින්දක් ලබාගත හැකිය. මී පැණි උෂ්ණ වේ. එබැවින් ශරීර උෂ්ණ අවස්ථාවලදී මී පැණි නොගත යුතුය. උෂ්ණ අධික භාජනවලට ද නොදැමිය යුතුය.

ඉක්කාව සුවවීමට දෙනු ලබන ඖෂධයක් මී පැණි. අතීසාර රෝගීන්ට, මුත්‍රා ආශ්‍රිත රෝගවලින් පෙළෙන රෝගීන්ට ද දෙනු ලබන විශේෂිත ඖෂධයක් දත් දිරායාම, දත්මුල් දිය වීම, දත්මුල්වලින් ලේ ගැලීම ආදි මුඛරෝගවලින් පෙළෙන අවස්ථාවලදී අරළු, පිලමුල්, මූණමල් පොතු එකට දමා සාදා තම්බාගත් ඖෂධීය ජලයට සීනක්කාරම් කුඩු දමා මී පැණි මිශ්‍රකර මුඛය සේදීමෙන් ඉක්මන් සුවයක් ලබාගත හැකිය. ආහාර දිරවීමේ ශක්තිය අඩු අයට මී පැණි ඉතා ගුණදායක වන අතර, ආහාර දිරවීම පහසුකරමින් ආමාශයේ අම්ලතාවය දුරු කරයි. ශක්තිය ලබා දෙන ආහාර රුචිය වැඩිකරන මී පැණි ඇස්වල කාන්තිභාවය වැඩිකරයි. සුව පහසු නින්දක් ලබාදෙයි. පිළිස්සුම් තුවාලවලට ක්ෂණික සුවයක් ලබාදෙන අතර ප්‍රියමනාප සිරුරකට අවශ්‍ය රූප සෝභාව ද ලබාදෙයි.

පණුරෝග සුවකරන අතර සෙම් පිත් කැස්ස, ඇදුම, පාචනය, වමනය සහ දියවැඩියාවට යහපත් වේ. මීපැණි සමේ ආලේප කිරීමෙන් ශරීරය වර්ණවත් බවක් ඇති කෙරේ. විෂබීජ නාශකයක්ද වන මී පැණි සමේ ගෑමෙන් මනා සුවයක් ලැබේ. රළු කසට මධුර ගුණයෙන් සමන්විත මී පැණි තුන්දොස් නසා රෝගාබාධ දුරුකරයි.

රාජපුර වෙද මැදුරේ
ප්‍රධාන ආයුර්වේද වෛද්‍ය

සුමිත් රාජපුර

සටහන මාධ්‍යවේදී

බී.ඇල්.ප්‍රේමරත්න

සිරුර වඩන තරුණ බව රැකදෙන රටඉඳි

මිනිසාගේ ආහාරය යම් පමණකට වැදගත්වේද පෝෂණයද ඔහුට ඒ තරමටම වැදගත් වේ. ආයුර්වේදයේ මෙන්ම දේශීය වෛද්‍ය ක්‍රමයේද පෝෂණය පිළිබඳව බොහෝ සෙයින් අවධානය යොමු කර තිබෙන බව දැක ගත හැකිය.

ආයුර්වේදයට අනුව රෝග සඳහා ප්‍රතිකාර කිරීමේදී ප්‍රධාන වශයෙන් කරනු ලබන්නේ ලංඝන හා වෘහණ ක්‍රමයයි. මේ අතුරින් වෘහණය රසායන හා වාජීකරණ අංශ යටතේ සිදුකරනු ලබයි. මෙම රසායන සහ වාජීකරණ අංශ යටතේ යොදනු ලබන ඖෂධ යෝගවලදී නැතිවම බැරි ඖෂධයක් ලෙස රටඉඳි හැඳින්විය හැකිය. ශරීරයට ශක්තිය, පෝෂණය සහ තර්පනය ලබාදීමට යොදනු ලබන ඖෂධ යෝගයන්හි යෙදෙන ප්‍රධාන ද්‍රව්‍යයක් ලෙස රටඉඳි හැඳින්විය හැක. ආහාරමය වශයෙන් විවිධ ආකාරයෙන් ප්‍රයෝජන ගනු ලබන රටඉඳි ඖෂධීය වශයෙන් ද බොහෝ ඖෂධ යෝග සඳහා යොදා ගනු ලබයි. පළතුරු වර්ග අතර අතිශය පෝෂ්‍යදායී පළතුරක් සේ ගැනෙන රටඉඳි මුස්ලිම් භක්තිකයන් අතර ඉතා ජනප්‍රිය වී ඇත්තේ රාමසාන් උපවාස සමයේදී ඔවුන්ගේ ශරීරයට අවශ්‍ය ශක්තිය සපයා දීමේදී අතිශය ශක්තිජනක ආහාරයක් වන බැවිනි.

රටඉඳි වැවෙන ප්‍රදේශ

උතුරු අප්‍රිකාව, ඊජිප්තුව, සිරියාව අතුළු අරාබි දේශයන්හිද සින්ද්, පංජාබ් දේශයන්හිද වැවෙයි. මේ අතර ඉතා ඈත අතීතයේ දී ප්‍රධාන වශයෙන් යුප්‍රටීස්-ටයිග්‍රීස් ආදී ගංගා නිම්න ආශ්‍රිතව හොඳින් වගා කර ඇති අතර වෙනත් ශාක නොවැවෙන වියළි කාන්තාර ප්‍රදේශවලද දක්නට ඇත.

රටඉඳි ශාකයේ ස්වරූපය

සාමාන්‍යයෙන් තල් ගසක හෝ පොල් ගසක හැඩහුරුකමට නෑකම් දක්වන රටඉඳි ගස් තල් ගසක් හෝ පොල් ගසක් තරමට උස්ව නොවැඩේ. සාමාන්‍යයෙන් රටඉඳි ගසක් අඩි 30-40 ක් පමණ උසට වැඩේ.

රටඉඳි සඳහා යෙදෙන නාම

පොදු සිංහල නාමය - රටඉඳි වන අතර සංස්කෘත බසින් - ඛාර්ජූර සහ ඛර්ජූරිකා නාමයන් යෙදෙයි.

හින්දි බසින් - ඛාජූර් සහ සෙද්ධි යන නාමයන් වන අතර වංග බසින් - තෙජූර් යන නාමයන් යෙදේ.

දෙමළ බසින් - ඉඩම්නාර් යනුවෙන්ද **තෙළිගු බසින්** - ඉෂාම් සහ වෙඩි යන නම්ද යෙදේ. **ඉංග්‍රීසි බසින්** රටඉඳි සදහා Wild Date Palm සහ Arabian Date Palm යනුවෙන්ද යෙදේ.

රටඉඳි සඳහා වන **උද්භිද විද්‍යාත්මක නාම -** Phoenix Zeylanica Trin- f සහ Phoenix sylvestris Roxb යන නාම යෙදෙන අතර කුලය -PALMACEAE හෙවත් නාරිකේල කුලය වේ.

රටඉඳි වල ප්‍රභේද

කුඩා ගෙඩි ඇති මස්හිග රටඉඳි (ක්ෂුද්‍ර ඛර්ජූර) නමින්ද, තද මසින් යුතු වටකුරු ලොකු ගෙඩි ඇති වර්ගය පිංඩ ඛර්ජුර නමින් ද ගැනෙයි. එසේම සුලේමාන් නමින් හැඳින්වෙනුයේ බුරුල මස ඇති ජුපිණ්ඩ ඛර්ජුරයි ගව දෙනකගේ තනපුඩු (ගෝස්තන) මෙන් දිගැටි වූ ගෙඩි ඇති වියලි පිංඩ ඛර්ජුරියම ජුහාරා (ජෝහෑවා) නාමයෙන්ද දක්වයි. මේ රටඉඳි වර්ගය බාගෙට ඉදුණු විට කඩා වියලා ගනු ලබන බවක්ද සමහරු කියති. සාමාන්‍යයෙන් සියලුම රටඉඳි වර්ග සමාන ගුණයක් පෙන්නුම් කරන නමුත් ඛර්ජුරය අනෙක් දෙවර්ගයට වඩා ගුණය අතින් පහත්ය. එහෙයින්ද එයට ස්වල්ප (ක්ෂුද්‍ර) ඛර්ජුර නාමය හිමිවී ඇත.

රටඉඳිවල ව්‍යවහාර අංග ආහාරමය වශයෙන් ගෙඩි යොදාගනු ලබන අතර, ඖෂධීය වශයෙන් ගෙඩි, ඇට සහ ගොබ යෙදේ.

මේ අතර රටඉඳි හා සම්බන්ධ ආගමික විශ්වාසයන් ද බොහෝ වේ. සමෘද්ධිය, ඉවසීම සහ ජයග්‍රහණයේ සංකේතයක් ලෙස රටඉඳි හඳුන්වා ඇත. එහි පූජනිය බව සලකා සතුරෙකුගේ ඉඩමක වැවෙන රටඉඳි ගසක් වුවද විනාශ නොකළ යුතු යැයි ආගමික විශ්වාසයක් වේ.

තවත් මතයක දැක්වෙනුයේ රටඉඳි යනු දෙවියන් වහන්සේ විසින් මවන ලද දෙයක් වන අතර දෙවියන් වහන්සේ විසින් මිනිසා මැවූ පසු ඉතිරිවූ අංශු වලින් රටඉඳි මවන ලද බවයි. මේ අතර රටඉඳිවල ඉතිහාසය ඉතා පැරණිය. මෙයට වසර පන්දහසකට පෙර සිට මිනිසා විසින් දැන සිටි පැරණිම වගාවක් ලෙස ද රටඉඳි වගාව දක්වනු ලැබේ.

රටඉඳි වල ආහාරමය වටිනාකම

රටඉඳි ආහාරමය වශයෙන් විවිධ ආකාරයෙන් ප්‍රයෝජනයට ගන්නා හැටි පෙනී යයි. විශේෂයෙන්ම ආහාරයට පසු ගනු ලබන පළතුරක් වශයෙන් ද රටඉඳි ගනු ලබන අතර විවිධ කේක් වර්ග සෑදීමේදී රටඉඳි යොදාගනු ලබයි. එසේම ඉතා හොද අතුරුපසක් ලෙසදරටඉඳි බාල, තරුණ, මහලු, සියලු දෙනාම ප්‍රියකරනු ලබයි. එසේම රටඉඳි යොදා සකස් කළ පාන වර්ගද විශේෂයෙන් මුස්ලිම් භක්තිකයන් රාමසාන් උපවාස කාලයේදී බොහෝ සෙයින් භාවිතයට ගනු ලබයි. තවද විවිධ උත්සව, ප්‍රිය සම්භාෂණ ආදියේදී නැතිවම බැරි මැලේ අච්චාරු සෑදීමේදී රටඉඳි අත්‍යාවශ්‍යම ද්‍රව්‍යයකි.

රටඉඳිවල ඖෂධීය වටිනාකම

රටඉඳි ඖෂධීය වශයෙන් ඉතා අගනා ගුණදෙන ද්‍රව්‍යයක් වන අතර විශේෂයෙන් ශරීරයට අවශ්‍ය ශක්තිය ලබා දෙන ඖෂධ යෝග සඳහා ගනු ලබයි. ශරීරයට අවශ්‍ය රසායන සහ වාජීකරණ ගුණ ලබා දෙන ඖෂධ රාශියක් රටඉඳි අඩංගුව සකස් කරනු ලබයි.

අශ්වගන්ධ රසායනය, අශ්වගන්ධා රිෂ්ඨය, ඛර්ජුරාසවය, ඛර්ජුරාදී චූර්ණය, ඛර්ජුරාදී ලේහය ආදිය රටඉඳි අඩංගු ප්‍රධාන ඖෂධ යෝග පවතී.

ලිංගික බෙලහීනතාවලදී රටඉඳි මදුලක ඇටය ඉවත් කර ගිතෙල් පුරවා මී පැණිවල බහා තබා දිනකට එක බැගින් කෑම ඉතා ගුණදායකය. රටඉඳි කිතුල්හකුරු, මුද්දරප්පලම්, කෝලිකුට්ටු යෝගය ද ලිංගික දුබලතා සැනෙකින් නසයි. මේ ආදී වූ ඖෂධ යෝග රාශියක් රටඉඳි අඩංගුව යොදනු ලබන අතර එමඟින් ශාරීරික දුබලතා නසා ශරීරයේ ශක්තිය ඇති කරන අතර ලිංගික දුබලතා ද නසා තරුණ බව රැකදෙයි. මෙනිසා මෙවන් අගනා ගුණදායක ඖෂධාහාරයක් වන රටඉඳි නිසි ලෙස ගැනීමෙන් ශාරීරික නිරෝගී බව රැක ගැනීමට හැකිවනවා ඇත.

පොල්ගොල්ල ශාස්ත්‍රාරවින්ද
වෛද්‍ය විද්‍යාලයේ
කථිකාචාර්ය වෛද්‍ය
මධුර පරණවිතාන

වෂී 2023 ක් වූ මාර්තු 17 වැනිදා සිකුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.